


91.7 දකුණට/සබරගමුවට 98.1 නැගෙනහිරට/ඌවට
96.7 උතුරු මැදට/වයඹට/මධ්‍යමට 107.2 බස්නාහිරට/ වයඹට

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
“රංගිරි ශ්‍රී ලංකා”
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු


# රංගිරි
## ශ්‍රී ලංකා

**සත්‍ය ගවේෂී බෞද්ධ හඬ**




91.7 දකුණට/සබරගමුවට 98.1 නැගෙනහිරට/ඌවට
96.7 උතුරු මැදට/වයඹට/මධ්‍යමට 107.2 බස්නාහිරට/ වයඹට

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
“රංගිරි ශ්‍රී ලංකා”
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2563 - ක්‍රි.ව. 2019
ඔක්තෝම්බර් (වප්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය ~ අන්තර්ජාල කලාපය

11






**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

UHF CH 60

PEO TV CH 22

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය**
**දේශයේ රන් හඬ**

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

WWW.rangirisrilankatv.com සහ WWW.rangiri.com ඔස්සේ



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# මෙත්සිත දසත පතුරවමු

අධ්‍යාත්මික සංවර්ධනයේ පරම පූජනීය වූ ස්වභාවික තත්වය මෛත්‍රිය ලෙස හැඳින්විය හැක. මෙහි විද්‍යාමාන වන ගැඹුරු බව නිසාම සමාන වචන සමුදායකින් ප්‍රකාශ කල හැකිය. පාළි භාෂාවෙන් මෙත්තා යනුවෙන්ද සංස්කෘත භාෂාවෙන් මෛත්‍රී, සෙනෙහස, දයාව, ප්‍රේමය, නුරාව, ඇල්ම, ආදරය, සානුකම්පිත දයාව යනුවෙන්ද සිංහල භාෂාවෙන් මිතුරුකම හිතවත්කම යනුවෙන්ද ඉංග්‍රීසි භාෂාවෙන් Living Kindness Love, Universal Love, True Friendship, Compassionate Love යනාදී ලෙෂ සටහන් කල හැක.

සැබෑ මිත්‍රත්වය අහස සේ විශාලය. පොළව සේ ගැඹුරුය. එලෙෂ ගැඹුරු හා පුළුල් සිතිවිල්ලක් ගොඩනගා ගැනීමට නම් විනිවිද දැකිය හැකි මනසක් තනාගත යුතුමය. වර්තමාන ලෝක ගැටළු හටගෙන ඇත්තේ ලෝභ, ද්වේශ, මෝහ යන ත්‍රිවිධ අකුසල මූල පදනම් කොට ගෙන බව ව්‍යක්ත ලෙස විවරණය කල හැකිය. ආගම මිනිස් දිවියෙන් සහ සමාජයෙන් ඈත්ව ස්වතන්ත්‍රව පවතින්නක් නොව ජීවිතය සහ සමාජය සමඟ තදින් බැඳී පවතින්නකි. මිනිසාගේ සහජ ආවේග උත්කර්ශනය පිණිස යොදා ගතහැකි ශක්තියක් අපට ඇත්නම් මේ මිහිතලය මානව වර්ගයාට සුඛිත මුදිතව ජීවත්වීමට සුදුසු තැනක් වනු ඇත.

මෛත්‍රිය ප්‍රතිවිරුද්ධ සිතිවිල්ල තරහාවයි. මේ දෙකම ජීවත් වන්නේ එකම තැනකය. චිත්ත අභ්‍යන්තරයෙහි පවතින මේවා මතු වන අවස්ථා පුහුණු නොකළ සිත ඕලාරිකය.

නහී පාපං කතං කම්මං
සජ්ජු බිරාච මුච්චති
ඩහන්තං බාල මන්වේති
හස්මච්ඡතෝච පාවකෝ

බාහිර අරමුණුවලින් අපේ මනස බාධක හා බලපෑම් වලට යටත් කරනු ලැබූ ඕනෑම විටෙක උදාසීනව පැවැති කෙළෙස් ධර්ම වරින්වර ඉස්මතු වන්නට පුළුවන. අපේ මනස තුළ පහළ වන කෙළෙස් ධර්ම එක්තරා ප්‍රමාණයකටවත් පාලනය කළ නොහැකි වන්නේ ඒවා සාවද්‍ය අයුරෙන් මැඩලීමට වෙර දැරීමෙනි.

විසම ලෝභය, ව්‍යාපාදය, ක්‍රෝධය, බද්ධ වෛරය, ගුණමකුකම, එකට එක කීම, දරදඬුකම, මානය, අභිමානය, මදය, ප්‍රමාදය යන සියල්ල සිත කිලිටි කරයි. මනුෂ්‍ය ප්‍රජාවටම මෙත් කළ යුතුය යන්න බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට ඉගැන්වීමකි. සකල ජීව සත්වයාටම මෙත් කළ යුතුබව කරණීය මෙත්ත සූත්‍රයේ ඉගැන්වීම් වලින් පැහැදිලි වෙයි. "සබ්බේ සත්තා" "සබ්බේ භූතා' යනුවෙන් එහි සඳහන් වෙයි. සකල ජීව සත්වයාටම මෙත් කළ යුතු බව එයින් ගම්‍ය වේ. බුදුදහම මධ්‍යම ප්‍රතිපදාව පිළිගත් ව්‍යවහාරෝචිත ධර්මයක් විය. බුදුරජාණන් වහන්සේ මෙම සූත්‍රයේදී තම අදහස් විකාශනය කර ඇති ආකාරය සැලකිල්ලට භාජනය විය යුතුය. කරණීය මෙත්ත සූත්‍රයේ පළමුවැනි පියවර වන්නේ යෝගාවචර සතිය කෙරෙහි තිබිය යුතු චරිත ලක්‍ෂණ සොළොසක් පෙන්වා දීමය.

දෙවැනි පියවර මෛත්‍රී භාවනාවේ ඇතුළත් වන කරුණු දැක්වීමය. තුන්වැනි පියවර වන්නේ සියළු සත්වයෝ යනු කවරහුදැයි පෙන්වා දීමය.

හතරවැනි පියවරේදී පුද්ගලයන්ගේ සුඛිත භාවයට අවහිර වන මානසික පරිසරයක් පවතින සාධක තුනකි. පස්වැනි පියවරෙන් මෛත්‍රිය පිරිය යුත්තේ කවර ආකල්ප පෙරදැරි කරගෙනද යන්නයි. සයවැනි පියවරෙන් දැක්වෙන්නේ මෛත්‍රී භාවනාවේ ඇති ආනිශංසයි.

ගිහි පැවිදි දෙපාර්ශවයටම ආදර්ශවත් මෙන්ම අවවාදාත්මක මෛත්‍රීය පිළිබඳව සූත්‍ර පිටකයේ හමුවන අතිමරණීය සූත්‍රය, මජ්ඣිම නිකායේ කක්චූපම සූත්‍රයයි. වර්තමාන කථාව තුළින් මෝලියඵග්ගුත්ත තෙරුන් අරහයා දේශනා කළ බව පැහැදිලිය. බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ සිටින කල්හි භික්ෂූන්ගෙන් පැමිණිල්ලක් ලැබිණි. ඒ මෝලියඵග්ගුත්ත හිමි සම්බන්ධයෙනි.

ඒ හිමියන් භික්ෂුණීන් සමඟ ඉතා ළඟ ඇසුරක් පවත්වන බවත් යම් භික්ෂුණියකට යමක් කී පමනින් කිපී ඒ අයට දොස් නගන බවත් භික්ෂුණීන්ද ඒ ආකාරයටම මෝලිය හිමියන්ට ඇලුම් කරන බවත් ප්‍රචලිත වීමෙන් තථාගතයන් වහන්සේ මේ භික්ෂුව කැඳවා ගිහිගෙය හැර පැවිදිවූ භික්ෂුවකට අශෝභන බවත් එයින් දකින අහන උදවියට අශෝභන බවත් අවබෝධ කර දුන්හ. ඒ සමගම මෙසේ දේශනා කළ සේක. ඔබ ආදරය කරන ඔබ කැමති යම් තැනැත්තෙකුට හෝ තැනැත්තියකට යමෙක් අතින් පහර දුන්නත් වචනයෙන් පහර දුන්නත් දඬුමුගුරුවලින් පහර දුන්නත් යමෙක් ඔබ ඉදිරියේදී ඔබේ ගුණ කීවත් ඒ අයගේ දොස් කීවත් පරුෂ වචනයෙන් බැණ වැදුනත් ඔබ තරහ නොගත යුතුය. එසේ තරහ නොගන්නට ඔබ පුහුණු විය යුතුය. එසේ ඔබට ඉවසා සිටිය නොහැකි නම් ඔබේ පුහුණුව ප්‍රමාණවත් නොවන බවත් තවත් පුහුණුවිය යුතු බවත් අවධාරණය කළහ. එවිට තමන් බුද්ධ ශ්‍රාවකයෙකු වන බවත් පෙන්වා දෙන සේක.

අපගේ හෘදය අභ්‍යන්තරයේ පවත්නා නරක, නපුරු සිතිවිලි මතුවන්නේ අලු යට ඇති ගිනි පුපුරු මෙනි. බාහිරින් එකතු වන අරමුණු හේතු කොට ගෙන ලෝභ, ද්වේශ, මෝහ මූලික කරගත් අකුෂල් පදනම් කරගෙන සිත් දූෂ්‍ය තත්වයට පත්වෙයි. බෞද්ධ මාර්ගය අනුගමනය කරමින් ඒ සියල්ල සිනහවෙන් ඉවසිය හැකි නම් එය මෛත්‍රියෙහි හාස්කමකි.

මහණෙනි, යමෙක් හෝ යම් පිරිසක් පැමිණ ඔබලාට දොස් පවරයිද පරුෂ වචනයෙන් බනියිද සිත් කෝප කරයිද ඒ හැම විටම මගේ සිත විපරිත නොවේවායි සිතන්නට සිත පුහුණු කරගැනීම ඉතාම වටින බවත් එසේ කිරීමෙන් තමන් නිවටයෙක් හෝ අධමයෙක් නොවන බවත් ශ්‍රේෂ්ඨයෙක් වන බවත් පෙන්වා දී වදාළ අතර මෛත්‍රිය පැතිර විය යුතු ආකාර පහක් මෙම සූත්‍රයේදි පැහැදිලි කොට ඇත.

1. යමෙක් මහපොළොව විනාශ කරමියි සිතා උදැල්ලක් රැගෙන කොටා ගෙන ගියත් එයින් මහපොළොව විනාශ කළ නොහැකිය. ඒ මහපොළාව විශාල වන හෙයිනි. එබැවින් මහ පොළොව සේ සමාන අප්‍රමාණව මෙත් පතුරවාලිය යුතුය.

2. යමෙක් පාටත් පින්සලුත් ගෙන මේ අහස රූප ඇඳ විනාශ කරමියි පැමිණියත් ඔහුට අහසෙහි රූප ඇඳිය නොහැකිය. ඒ මේ ආකාශ ධාතුව අතිවිශාල බැවිනි. එබැවින් අහස හා සමාන මෙත් සිත පතුරුවාලිය යුතුය.

3. යමෙක් හුළු එළියකින් ගංගා නම් ගඟ උණු කරන්නට උත්සාහ කළත් එය කළ නොහැකි වන්නේ ගංගා නම් ගඟ එතරම්ම දිග බැවිනි. එතරම්ම දිගට මෙත් සිත පතුරුවා ලිය යුතුය.

4. ඉතාම මෘදු සම් ඇතිරිල්ලක සර සර හඬ නොනගින්නක් මෙන් මෙත් සිත පවතින සිත නිහඬය. පතුරුවා ලිය යුතුය.

5. පහත් ගති ඇති සොරුන් කියතකින් අත පය සිඳ දැමුවත් එහිදීත් වෛර නොකොට මෙත් සිත පතුරුවා ලිය යුතුය.

මෙත්තානි අසේකා
මෙහෙණින් වහන්සේ



# වප් පෝය විස්තරය

තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ ස්ථානයක් තෝරාගෙන වස් වසභ ලෙසටය. "වස්සානෙ වස්සං උපගන්තුං" යන බුද්ධ නියමයෙන් ඒ බව පැහැදිලි වෙයි. සුදුසු ස්ථානලෙස දක්වා ඇත්තේ ආරණ්‍ය සෙනසුනක ආරාමයක සම්බාධක වලින් තොර ස්ථානයක යන සුවිශේෂි තැන්ය.

එම නියමයන්ට අනුව උපසපන් භික්ෂු, භික්ෂුණී යන දෙපිරිසම උපසපන් වූ විට, වස්විසීම සිදුකළ යුතුවන්නේය. වස් විසූ කාලසීමාව තුළ විහාරස්ථානයේ (වස්විසූ ස්ථානයේ) රැඳී සිටිමින් ආමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවන්හිද යෙදීම සිදුවේ. තම සඳහා තම දායක, දායිකා වන්ගේ සහායද නොඅඩුව ලැබේ. වෙනත් කාලවලට වඩා වස්කාලයතුළ විවිධ පිංකම් සිදුකරනු ලබති. බුද්ධකාලයේ වැඩ සිටි රහත් භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් මෙන්ම, උපදෙස්ද ලබාගෙන ප්‍රතිපත්ති පූජාවෙහි යෙදීමට දක්වන්නේ මහත් කැමැත්තකි.

දිනක් රහත් භික්ෂූන් වහන්සේලා රැස්ව සිටි ස්ථානයට වැඩම කළ බුදුරජානන් වහන්සේ එම භික්ෂූන් වහන්සේලාගෙන් ප්‍රශ්න කිහිපයක් විමසා සිටිසේක. එම ප්‍රශ්න වලට නිවරැදි පිළිතුර සැපයූ සැරියුත් මහරහතන් වහන්සේට භික්ෂූන් අතරින් ප්‍රඥාවෙන් අගතනතුර ප්‍රදානය කළ බුදුරජාණන් වහන්සේ අවවාද ලබාදී වෙහෙරට වැඩමබළ සේක. මෙම ශාසනික වැදගත් සිදුවීම සිදුවී ඇත්තේ වස් පොහෝ දිනකය. ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ දක්ෂිණ ශාඛාව මෙරටට වැඩම කරවීම, දූත පිරිසක් දඹදිවට යවන ලද්දේද මෙවැනි පොහෝ දිනකය.

ශ්‍රී ලංකාවේ පැවිදි වූ අරිට්ඨ තෙරුන් වහන්සේ අභිධර්මය හදාරා එය සංඝයා වහන්සෙලා ඉදිරියේ දේශනා කෙළේද වස් පොහෝ දිනකවීම වැදගත් සිද්ධියකි. ලංකාවාසී බෞද්ධ ජනතාව මෙම පොහෝ දිනයේ වෙහෙර,විහාර ස්ථානයන්ට රැස්ව ඇමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවන්හිද යෙදෙනු දක්නට ලැබෙන්නකි. මෙම කාලසීමාව බෞද්ධ ජනතාවගේ අගයකල හැකිය. පොහෝ දිනය දෙලොව වැඩදායක දිනයක් ලෙසට පත්කර ගැනීමට ඉටාගත යුතුවේ.

ඇම්.ඩී.විජයවර්ධන

පුදබිමක අසිරිය

# සිතුල්පව්ව රජමහ විහාරය



දකුණු පළාතේ ඇති පෞරාණික විහාර ස්ථාන අතරින් ප්‍රමුඛ ස්ථානයෙහිලා සැළකෙන විහරස්ථානයක් වශයෙන් සිතුල්පව්ව වෙහෙර හැඳින්වීම උචිතය. වංශකතා සාහිත්‍යයෙහිද, ශිලා ලේඛනවලද, අභිලේඛන වලද මෙම විහාරස්ථානය ගැන තොරතුරු සඳහන් වෙයි. "චිත්තපබ්බත" නමින් හඳුන්වාදී ඇත්තේ පාලි ග්‍රන්ථයන්හිය. "යාල අභය" භූමියට අසන්නව රමණීය උසස් භූමියක මෙම විහාරය පිහිටා තිබේ.

දකුණු පළාතේ රාජ්‍ය පාලකයා වශයෙන් සිටි කාවන්තිස්ස රජු විසින් මෙම විහාරය ඉදිකළ බව වංශකතාවල සඳහන් වෙයි.
මහාවංශය,ධාතුවංශය යන ග්‍රන්ථවල සඳහන් වන්නේ සම්භාවණීය විහාරයක් වශයෙන් මෙම විහාරය එවකට ප්‍රකටව පැවැති බවයි. ක්‍රි.පූ.3 වන සියවසේදී අනුරාධපුර මහමෙවුනා උයනේ සිදු වූ බෝධි රෝපණ උත්සවයකට රෝහණ ප්‍රදේහයේ, චිත්තපබ්බතයෙන් ආගමික නායකයින් පැමිණ ඇත.

ඒ අනුව එම ප්‍රදේශයේ ජීවත්වී ඇත්තේ බෞද්ධ ශාක්‍යයන් බව පැවසේ. චිත්තපබ්බත විහාරය ඇසුරු කරගෙන භික්ෂූන් වහන්සේලාට පූජාකළ බව ලෙන්ලිපි වලින් විස්තර වේ. වසභ රජතුමා, ගජබා රජතුමා, මහල්ලක නාග රජතුමා, කණිෂ්ටතිස්ස රජතුමා යන රජවරු චිත්තපබ්බත විහාරයට විහාරාංග ඉදිකිරීමෙන හා විවිධ පූජාවන් පැවැත්වූ බව මහාවංශයේ සඳහන්වෙයි. අනුරාධපුර රජකල රජවරුන්ගෙ අනුග්‍රහය ලැබී ඇත්තේ මෙම විහාරය වැදගත් විහාරස්ථානයක් වශයෙන් සැළකූ නිසා බව ඉතිහාසඥයින්ගේ අදහසයි. චිත්තපබ්බත වෙහෙරෙහි වැඩ විසූ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබාදෙන වෛද්‍යමධ්‍යස්ථානයක් සාදා සංඝයාවහන්සේලාට ෂ ගජබා රජතුමා විසින් පූජාකල බව වංශකතාවල දැක්වේ. මාගීඵලයන්ට පත් වූ භික්ෂූන්වහන්සෙ සලසා තිබූබව දැනට හමු වී ඇති සෙල්ලිපි සාක්ෂි දරයි.

භාවනාවේ යෙදීම සඳහා අවශ්‍ය පරිසරයක් මෙහි තිබෙන අතර ලංකාවේ විවිධ ප්‍රදේශවලින් පැමිණෙන ජනයා නේවාසිකව භාවනාවේ යෙදී චිත්ත සමාධිය ලබාගත් බවට තොරතුරු ඇතුළත් සෙල්ලිපි හමුවී තිබේ. චිත්තපබ්බත විහාරය අවටින් හමුවී ඇති නටඹුන් රාශියක් ගැන තොරතුරු සඳහන් වෙයි. ස්තූප, ලෙන් විහාර, පිළිම ගෙවල්, වටදාගෙය, බෝසත් පිළිම, බුද්ධ ප්‍රතිමාවන්ද ප්‍රධාන වේ. සිරිපතුල, ආසනඝර, කොරවක්ගල්, අවලෝතිතේශ්වර, බෝසත් පිළිම මේ අතර වේ.

කාලයාගේ ඇවෑමෙන් ජනාකීර්ණ තත්වයෙන් ඈත්ව තිබූ මෙම ඓතිහාසික පිංබිම වනගතව පැවැති අතර 19 සියවසේ අගභාලයේ දී පමණ භික්ෂූන් වහන්සේලාගේ කැපවීම මත මෙම ඓතිහාසික පිංබිම යලි ප්‍රතිසංස්කරණය සිදුවිය. වනගත ෂතුන්ගෙන් ගහණවූ මෙම පිංබිම ජනයා ගැවසෙන ස්ථානයක් බවට පත්කර ගැනීමට විහාර භාරකාරත්වය ඉසුලූ භික්ෂූන් වහන්සේලා සමත්වූහ. වර්තමානය වනවිට විහාරාංගයන්ගෙන් සමන්විත ඉතා රමණීය පිංබිමක් වශයෙන් බැබළෙයි. බෞද්ධ ජනතාවගේ ආරක්ෂාවත්, කැපවීමත් මේ සඳහා බලපෑ බව සඳහන් කිරීමට පුළුවන.විහාර පරිසරයත් ගොඩනැගිල්ලත්, ආරක්ෂා කර ගැනිම අප සතු වගතීම බව සඳහන්කළ හැකිය.





ඇම්.ඩී.විජයවර්ධන
තලවත්තේගෙදර

පෙරලෙන ගලේ පාසි නොබැදේ.

# දුර්ලභව ලැබිය යුතු කරුණු හතරක්

මේ ලෝකයේ දුර්ලභව ලැබිය හැකි කරුණු රාශියක් තිබුණද බුදුපියාණන් වහන්සේ දේශනා කළ සුවිශේෂි කරුණු හතරක් පිළිබඳ  මෙම ලිපියෙන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. දුර්ලභ, අසීරු, අමාරු, අපහසු යන වචන අප කනට එතරම් සුවදායක නොවන වග අමුතුවෙන් කිව යුතු නැත. නමුදු එහි වටිනාකම ඇත්තේද ඒ තුළමය. අප ලේසියෙන් ලබා ගන්නා දේකට වඩා අමාරුවෙන් ලබා ගන්නා දෙයක් අපට ඉතා වැදගත් වනු ඇත. ඒ ආකාරයෙන්ම මෙම කරුණු පිළිබඳවද සිතීමට පුළුවන. විශාල කැප කිරීමක් හා පරිත්‍යාගයක් කරමින් මෙම කරුණු හතර ලබාගත යුතු බව සිතිය යුතුය.



ධම්ම පදය නම් වූ උතුම් බණ පොතෙහි ඒ පිළිබඳ විස්තරාත්මකව කරුණු විග්‍රහ කොට ඇත. අප සාමාන්‍යයෙන් එදිනෙදා ජීවිතයේ නොයෙක් දේවල් පහසුවෙන් ලබාගනු ඇත. අද කාලය වන විට මුදල් තුළින් සියල්ල නිර්ණය වනු ඇත. එසේ වුවද කොතරම් මුදල් තිබුණත් කුමන හැකියාවන් තිබුණත් ඉහත මතක් කළ දුර්ලභ කරුණු හතර ලබා ගත යුතු බව බුදුහිමි දේශනා කොට ඇත. ධම්ම පදයේ බුද්ධ වග්ගයෙ 4 වෙනි ගාථාව මේ සම්බන්ධව ඉතා වැදගත් වේ. එනම්,

**"කිච්ඡො මනුස්ස පටිලාභො**
**කිච්ඡං මච්චානා ජීවිතං**
**කිච්ඡං සද්ධම්ම සවණං**
**කිච්ඡො බුද්ධානං උප්පාදෝ "**

මිනිසත් බව ලැබුම හා දිවි රැකුම දුෂ්කරය. සදහම් ඇසුම හා බුදු උපත ලැබීමද දුෂ්කරය. පළමු කාරණය වන්නේ මිනිසත්  බව ලැබීමයි. අන් සත්ත්වයන් බොහෝ දුරට අනුකරණයෙන් හා බියට සැකට එම ආත්මය තුළ යම් යම් දේවල් සිදු කරති. නමුදු මිනිසාට ඕනෑම දෙයක් සිතා බලා විනිශ්චය කොට තීරණය කළ හැකිය. එතනදී කාලාම සූත්‍රයේ සඳහන් පරිදි කරුණු 10කින් බැහැර වී යමක් කුසලය, නිර්වද්‍යය නුවණැත්තාගේ ප්‍රශංසාවට හේතුය, සමාදන් වී සම්පූර්ණ කිරීම හිත පිණිස, සැප පිණිස හේතු වේ යනුවෙන් තමාටම වැටහේද එවිට එහි යෙදීමට පුළුවන් ආකාරයට ධර්මය වැළඳ ගැනීම පිළිබඳව උසස් මනසක් ලැබූ මිනිසාට කළ හැකි බව පැහැදිලි කොට ඇත.

" **කිච්ඡෝ මනුස්ස පටිලාභෝ** '' යනුවෙන් වදාළේ එම හේතුව නිසාය. ඉතා දුකසේ මහත් පිනකින් ලැබිය යුතු දෙයක් ලෙස එය විග්‍රහ කොට ඇත. " **දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ** " යනුවෙන් ලෝවැඩ සඟරාවේද ඒ බව පැහැදිලි කොට ඇත. තව පැත්තකින් අංග සම්පූර්ණ මිනිස් දිවියක් ලැබීමද අසීරු කාර්යයකි. ඒ සඳහා සසර පින් අවශ්‍ය වේ. අද සමාජය දෙස බැලීමේ දී ඒ බව ප්‍රත්‍යයක්ෂ වේ. අඳ,ගොළු, බිහිරි නොවී අත් පා ආදී අවයව වකුටු නොවී අංග සම්පූර්ණ ශරීරයක් ලැබීම දුර්ලභ බැවින් ද, මිනිස් ආත්මයක් ලැබීම අන් සියල්ලටම වඩා උතුම් සේම දුර්ලභ වන්නේය. " **දුල්ලභංච මනුස්සත්තං** " යන ආකාරයට දුර්ලභව ලැබූ මිනිස් බව රැක ගැනීමත් ගුණ ධර්ම ප්‍රගුණ කරමින්, පින් දහම් සිදු කරමින් මිනිස් දිවිය අර්ථවත් කර ගැනීමට නොපසුබට විය යුතුය.

දෙවන කාරණය දිවි රැක ගැනීම නොහොත් පවත්වා ගැනීම අපහසු බවය. අප ලද දිවිය හරියට තණ අග පිණි බිඳක් හා සමානය. ක්ෂණයකින් විනාශ වීමේ ප්‍රවණතාවය වැඩිය. ස්වභාවික විපත්, සංසාරික කර්ම ශක්තීන්, ඇසුරු කරන්නන්ගෙන් වන අයහපත් ක්‍රියා සතා සිව්පාවුන්ගෙන් සිදුවන හානි ආදී වශයෙන් නිතර මිනිස් දිවියට එළඹෙන අනතුරු එමටය. එලෙස ජීවත්වීම උදෙසා නොයෙක් රැකී-රක්ෂා කිරීමට සිදුවේ. එලෙසම මෙම ශරීරය නිතර පෝෂණය කළ යුතුව ඇත. ආහාර-පාන, බේත්-හේත්, ඇඳුම්-පැළඳුම්, ගෙවල්-දොරවල් ශරීරය සඳහා වෙන් කළ යුතුය. මේ සියල්ලම කිරීමට පුංචි කාලයක් පවතින බැවින් ද, එතුළිනුත් නින්දට ජීවිතයේ භාගයක්ම ගෙවන බැවින් ද දිවි පැවැත්ම ඉතා දුෂ්කර කාර්යයක් වන්නේය.

තෙවන කාරණයෙන් පැහැදිලි වන්නේ සදහම් ඇසීම දුෂ්කර බවය. **"කිච්ඡං සද්ධම්ම සවණං"** යනුවෙන් දේශනා කළේ එයයි. හැම යුගයක් තුළම සද්ධර්මය ඇසීමට නොලැබේ. සමහර යුගවල සද්ධර්මය ඇසීමට තබා සිතීමටවත් අපහසුය. දහම්සොඬ කතා පුවතෙන් ඒ බව මනාව පැහැදිලි වේ. සදහම්  ඇසීමට තබා සිතීමටවත් අපහසුය. දහම්සොඬ කතා පුවතෙන් ඒ බව මනාව පැහැදිලි වේ. සදහම් ඇසීමට බුදු කෙනෙකු ලොව පහළ විය යුතුය. **"සද්ධම්මෝ පරම දුල්ලභෝ"** යනුවෙන් අර්ථවත් වන්නේ එහි අසීරු බව හා දුර්ලභ බවය. ධර්මය තිබුණද තම ඥාන පමණින්ම දැනගත යුතු වන්නේය. ''සුබා සද්ධම්ම දේශනා'' ධර්මය ඇසීමට ඇත්නම් එය සැප පිණිසම පවතී.
බුදු උපතක් සිදුවීම සිව්වන දුෂ්කර කාර්යයයි. බුදු කෙනෙක් ලොව පහල වීම කප් කෙල සුවහස් ගණනකිනුදු සිදු නොවන්නකි. **"සුඛෝ බුද්ධානං උප්පාදෝ"** යනුවෙන් බුදු උපත තුන් ලොවටම සැපතක් වන්නේ එම දුෂ්කර බව හේතුවෙනි.

ඉහත කරුණු හතරම ලැබීම දුෂ්කර කාර්යයෝ වෙති. **කිච්ඡෝ** යනුවෙන් හැඳින්වෙන්නේ **කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලනවටත් වඩා මිනිස් දිවිය ලැබීම අසීරු වන බවයි.** නමුදු අද මේ කරුණු වල වටිනාකම අවබෝධ නොවී තිබීම කණගාටුවට කරුණකි. දීර්ග සංසාර චක්‍රයට හසු වී සිටින අප මිනිසත් බව නැමැති උතුම්ම, ශ්‍රේෂ්ඨතම ආත්ම භාවය ලබා ඇති මුත් ඉන් නිසියාකාරව ප්‍රයෝජනය ලබා ගන්නේ ස්වල්ප දෙනෙකි. බොහෝ දෙනෙක් ගුණ-ධර්ම, යුතුකම් හා වගකීම්, සිරිත්-විරිත් වල  පල්ලට දමා තිබේ. ආත්මාර්ථකාමී සමාජයක් තුළ මිනිසත්කම කැළෑ වැදී ඇත. පැණි හැලියට වැටුණු ඇඹලයෙක් සේ සැපයයි සිතා දුක්ම විඳිති. ආධ්‍යාත්මික ගුණ ධර්ම ප්‍රගුණ කිරීම, වර්ධනය කිරීම ඉදිරියට කල් දමාගෙන ඇත. ඔවුන් පිළිබඳව බුදුරදුන් දේශනා  කළේ **"පමාදෝ මච්චුනෝ පදං"** ප්‍රමාද වූවෝ මළවුන් හා සමාන බවයි. මිනිසත් බවෙන් විය යුතු ක්‍රියාවලිය දැන හඳුනාගෙන අද අදම එය කළ යුතුය. හෙටට කල් දැමීම බුදු දහමේ පිළිවෙත නොවේ. ප්‍රමාද නොවී නිවන් මගට පිවිස ඒ ඔස්සේ ගමන් කළ යුතුය. නැතිනම් හුස්ම පොද පිටවීමට පෙර දුක් වීමට සිදුවනු නියතය. එම හේතුවෙන් පරලොව දිවියද අභෞව්‍යස්ථාන වල බපදීමට එය හේතුවක් වනු ඇත. බහත කරුණු සිහියට ගෙන යුතුකම් වගකීම් බටු කරමින් පින් දහම්ද සිදු කරමින් ගුණ ධර්මද ප්‍රගුණ කරමින් දුර්ලභව බද මිනිසත් බව අර්ථවත් කර ගැනීමට උත්සහාවත් වෙමු.

කු/නික/වාරි රතනසෙල ඓතිහාසික මහ පිරිවෙනෙහි
නියෝජ්‍ය පරිවේණාධිපති
ගලගෙදර රතනවංශ හිමි.

# සමථ හා විදසුන් භාවනා පිළිබඳ මූලික කරුණු

විමුක්තිය ලබාගැනීම පිණිස උත්සාහ කරන්නන් භාවනා සඳහා යොමුවිය යුතු බව බුදුදහම පෙන්වා දෙයි. මූලික භාවනා ක්‍රම 02ක් ඇසුරෙන් කුසල වැඩිම හා ප්‍රඥාව දියුණු කිරීම සිදුකළ හැකිය.

සිත දියුණු කර ගැනීම සඳහාත් සමාධිගත කරගැනීම පිණිසත් චිත්ත භාවනා හෙවත් සමථ භාවනා උපකාරී වේ. නීවරණ ධර්මයන් සංසිඳවන නිසා සමථ නම් වන්නේය. සමථ භාවනාව අරමුණු නැතහොත් කර්මස්ථාන 40කින් යුක්තය.

නුවණ හා ප්‍රඥාව දියුණු වන්නේ විදර්ශනා භාවනාවෙනි. භාවනාවට යොමු වන්නවුන් දත යුතු මූලික කරුණු ඔබ වෙත ගෙන ඒම මෙම කෙටි ලිපියේ අරමුණයි.

### කසින දසය

1. පඨවි කසිණ
2. ආපො කසිණ
3. තෙජො කසිණ
4. වායෝ කසිණ
5. නීල කසිණ
6. පීත කසිණ
7. ලෝහිත කසිණ
8. ඕතාත කසිණ
9. ආකාස කසිණ
10. ආලෝක කසිණ

යයි කසිණ දසයකි.

### අසුභ දසය

1. උද්ධුමාතක
2. විනීලක
3. විපුබ්බක
4. විච්ඡිද්දක
5. වික්ඛායික
6. වික්ඛිත්තක
7. හතවික්ඛිත්තක
8. ලොහිතක
9. පුළවක
10. අට්ඨික

යයි පිළිකුල් කටයුතු අසුභ දසයකි.

### අනුස්සති දසය

1. බුද්ධානුස්සති
2. ධම්මානුස්සති
3. සංඝානුස්සති
4. සීලානුස්සති
5. චාගානුස්සති
6. දෙවතානුස්සති
7. උපසමානුස්සති
8. මරණානුස්ති
9. කායගතාස්ති
10. ආනාපානස්ති

යයි අනුස්සති දසයකි.

### අප්පමඤ්ඤා සතර

1. මෙත්තා
2. කරුණා
3. මුදිතා
4. උපෙක්ඛා

යන සතර අප්‍රමාණ්‍ය නම් වෙති.

### ආහාරෙ පටික්කුල සඤ්ඤා සතර

1. කබලිකාරාහාර
2. පස්සාහාර
3. මනොසංචෙතනාහාර
4. විඤ්ඤාණාහාර

යයි සතර විධිය.

### චතුධාතු වවත්ථාන

නාම රූප ධර්මයන් ගෙන් යුත් සත්ව ශරීරය පඨවි, ආපො, තේජෝ, වායු යනුවෙන් ධාතු වශයෙන් වෙන්කොට බැලීම.

### ආරුප්ප සතර

1. ආකාසානඤ්චායතන
2. විඤ්ඤාණඤ්චායතන
3. ආකිඤ්චඤ්ඤායතන
4. නෙසඤ්ඤානාසඤ්ඤායතන යන මේ සතරයි.

නුවණ හෙවත් ප්‍රඥාව දියුණු කරගැනීමට ඉවහල් වන භාවනාව විදර්ශනා භාවනාව නම් වේ. සියලු දුක් නැති කිරීමෙන් ලැබෙන නිවන් සුව පසක් කර ගන්නට හැකිවන්නේ විදර්ශනා භාවනාව වැඩීමෙනි.

ලොව සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ත්‍රිලක්ෂණයට නගා විශේෂයෙන් දැකීමට උපකාර වන නුවණ විදර්ශනා භාවනාවය. පඤ්ඤා භාවනා යනුවෙන් හැඳින්වෙන්නේද විදර්ශනා භාවනාවයි.

විදර්ශනා භාවනාව සම්පූර්ණ කර ගන්නට පහත සඳහන් කරුණු දත යුතුය.

### සප්ත විශුද්ධිය

1. සීල විශුද්ධි
2. චිත්ත විශුද්ධි
3. දිට්ඨි විශුද්ධි
4. කඞ්ඛා විතරණ විශුද්ධි
5. මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධි
6. පටිපදා ඤාණ දස්සන විශුද්ධි
7. ඤාණ දස්සන විශුද්ධි

යයි විශුද්ධි සතකි.

### ත්‍රිලක්ෂණ

1. අනිත්‍ය
2. දුක්ඛ
3. අනාත්ම යයි තුනකි.

### අනුපස්සනා

1. අනිච්චානුපස්සනා
2. දුක්ඛානුපස්සනා
3. අනත්තානුපස්සනා

යනු ත්‍රිවිධ අනුපස්සනායි.

### මොක්ෂ තුනකි.

1. සුඤ්ඤාත
2. අනිමිත්ත
3. අප්පණිහිත

යනු ත්‍රිවිධ මෝක්ෂයි.

### විමෝක්ෂ මුඛ

1. සුඤ්ඤත විමොක්ඛ මුඛ
2. අනිමිත්ත විමොක්ඛ මුඛ
3. අප්පණිහිත විමොක්ඛ

මුඛ යනු ත්‍රිවිධ විමොක්ඛ මුඛ නම්, සමථ විදර්ශනා භාවනා වඩන යෝගීහු විසින් මේ මූලික කරුණු දත යුතුය. චිත්ත විවේකය හා විමුක්ති සුවය ලබා ගැනීමට මේ ද්විවිධ භාවනාවන් මහෝපකාරි වේ.

# මෛත්‍රී භාවනාවේ ආනිශංස



1. සැපසේ නිදා ගැනීම
2. සැපසේ අවදි වීම
3. බියකරු සිහින නොපෙනීම
4. ගෙල පැලදි රන් මාලයක් මෙන් මිනිසුන්ට ප්‍රියවීම.
5. යක්ෂයන්ට පවා ප්‍රියවීම
6. දෙවියන් විසින් ආරක්ෂා කිරීම
7. ගිනි, සර්ප විෂ, ආයුධ වලින් වන භයානක සිහින නොපෙනීම.
8. සිත සමාධිගත බව
9. මුහුණේ පැහැපත් බව සහ වර්ණවත් වීම
10. මහා සිහියෙන් යුතුව කලුරිය කිරීම.
11. මේ ජීවිත කාලය තුල රහස් නොවුනොත් මරණෙන් මතු බ්‍රහ්ම ලෝකයේ ඉපදීම..


(අංගුත්තර නිකායේ මෛත්‍රී සූත්‍රය ඇසුරිණි.)



# භාවනා කිරීමට සහ සිත දියුණු කරගැනීමට කැමති පුද්ගලයන් විසින් අනුගමනය කළ යුතු කරුණු

1. අලෝභ අදහස් දියුණු කර ගැනීම.
2. ලෝභය සියලු දුකට මුල බව සිතීම.
3. මෛත්‍රී අදහස් වැඩිදියුණු කරගැනීම.
4. වෛරී සිතුවිලි වලින් බැහැරවීම.
5. ප්‍රඥාවන්ත අදහස් ඇතිකර ගැනීම.
6. මෝහය (මුලාව) එලොව මෙලොව අඳුරට මුල බව සිතීම.
7. කාම තෘෂ්ණාදියෙන් දුරුවීමට උත්සුකවීම.
8. විවේකීව භාවනා කිරීමේ අදහස් වැඩි දියුණු කරගැනීම.
9. පිරිසගෙන් ඈත්ව තනිව භාවනා කිරීමට යොමුවීම.
10. සිත, කය, වචනය සංවර කරගැනීම පිණිස සැම විටම උත්සුක වීම.

**උපතින් පිරිසිදු සිත බාහිර කෙලෙස් වලින් දූෂිත වේ.**



**ඉධ මෝදති පෙච්ච මෝදති**
**කත පුඤ්ඤො උභයත්ථ මෝදති**
**සෝ මෝදති සෝ පමෝදති**
**දිස්වා කම්ම විසුද්ධි මත්තනෝ**

# පින්කිරීම

## දෙලොව සතුටම හේතුවේ

**පින්කළ තැනැත්තා මෙලොවත් පරලොවත් සතුටුවෙන බව පැහැදිළි කර දෙමින් තථාගතයන් වහන්සේ මෙම ගාථා ධර්මය ධම්මික නම් උපාසකතුමෙකු අරභයා දේශනා කළ බව සඳහන් වේ. ධම්මපදයේ යමකවර්ගයට අයත් 16 වෙනි ගාථාව මෙයයි.**

ධම්මික උපාසකතුමා ජීවත්වුනේ සැවැත් නුවර. එතුමා නිතර නිතර බුදු හාමුදුරුවෝ දකින්නට ගියා. බණ ඇසුවා. පින්දහම් කළා. මිනිස් ලොව උපත ලද සත්වයෙකුට අයිති ව ඇති සාධු සම්මත යහජීවන පැවැත්මෙන් එතුමා නියම ඵල ප්‍රයෝජන ගත්තා. අන්තිමේ මරණ මංචකයට පත්ව සිටියදී එතුමාගේ ඉල්ලීම පරිදි භික්ෂූන් වහන්සේලා වැඩම කරවා මහාසතිපට්ඨාන සූත්‍රය දේශනා කරවාගත්තා.

උන්වහන්සේලා සතිපට්ඨාන දේශනාව සිදුකරන අතර උපාසක තුමාට ගති නිමිති පහළ විය. එනම් ඊළඟ භවයේ ලබන්නාවූ භවය පිළිබඳ තොරතුරු දැකීමයි. පින්කළ තැනැත්තා මෙලොවදී සතුටින් ජීවත්වී පරලොව ද සතුටින් ජීවත් වන බැවින් ධම්මික උපාසක තුමාගේ ඊළඟ උපත සිදුවන්නේ සදෙව් ලොවින් එක් ලොවකයි. මේ නිසා සදෙව් ලෝ වැසි දෙවියෝ පැමිණ තම තමන්ගේ දිව්‍ය ලෝකවලට පැමිණෙන ලෙස ආයාචනා කරන ආකාරයත්, දිව්‍ය රථ පැමිණ අහසේ නවතා තිබෙන ආකාරයත් ධම්මික උපාසක තුමාට පෙනෙන්න වුණා. ඒවා පෙනෙන්නේ ගති නිමිති ලෙස අදාළ පුද්ගලයාට පමණයි.

මෙසේ දෙවියන්ගේ ආයාචනා බලවත් වූ විට උපාසක තුමා භික්ෂූන් වහන්සේලා දේශනා කරන සතිපට්ඨාන දේශනාව අවසන් වනතුරු සිටින්නැයි (ඉවසන්නැයි) දෙවියන්ට අතින් සංඥා කළේය. ඒ දුටු භික්ෂූන් වහන්සේලා එය තමන් වහන්සේලාට කළ සංඥාවක් ලෙස සිතූහ. බණ අවසන් කරන්නැයි කරන ඉල්ලීමක් ලෙස සිතා දේශනාව අවසන් කොට උන්වහන්සේලා විහාරයට වැඩම කළහ.

නැවත උපාසක තුමා පියවි සිහිය ලැබ භික්ෂූන් වහන්සේලා නොදැක තොරතුරු විමසීය. සිදුවූ දේ දරුවන් විසින් පැහැදිළි කරදෙන ලදී. එවිට උපාසක තුමා තමා දුටු ගති නිමිති විස්තර කර දී ඒ බව සනාථ කිරිමට මල්දමක් අහසට දැමීය. ඒ මල්දම දිව්‍ය රථයක රැඳී අහසෙහි නතර විය. මෙම අසිරිය තම දරුවන්ට පෙන්වා තමා කළ පින් දහම් නිසා මරණින් මතු දෙව් ලොව උපදින බව ප්‍රකාශ කොට දරුවන්ට අවවාද දී මියගොස් තව්තිසා දෙව්ලොව උපත ලදහ. සිදුවූ සියල්ල භික්ෂූන් වහන්සේලා විසින් බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කළ කල්හී බුදුරජාණන් වහන්සේ ධම්මික උපාසක තුමා මිය ගොස් තව්තිසා දෙව්ලොව උපත ලද බව පෙන්වා දෙමින් කුසල් දහම් වල අප්‍රමාදව යෙදෙන ගිහි පැවිදි කවුරුන් වුවද මෙලොව පරලොව දෙකෙහි බොහෝ සේ සතුටුවන බව දේශනා කොට වදාළහ.

පින්වත් සත්පුරුෂයිනි, මේ තථාගත දේශනාවට අනුව අප තේරුම් ගත යුතු වැදගත් කරුණු රාශියක් තිබෙනවා. අපිට සතුටු විය හැකි ක්‍රම කොතෙක් තිබුණත් නිවැරදි හා අර්ථවත් සතුට, පින්දහම් තුළින් ලබන සතුටයි. ඉහත ගාථාවට අනුව මේ අර්ථවත් සතුට ලබන්නා හඳුන්වන්නේ 'කත පුඤ්ඤො' යනුවෙනි. ඔහු සිත - කය - වචනය යන තුන්දොරින් සංවර වී දස පින් ක්‍රියාවන්හි යෙදෙන තැනැත්තාය.

දස පුණ්‍යක්‍රියා යනු මොනවාදැයි සැකෙවින් හඳුනාගැනීම ධම්මික උපාසක තුමා මෙන් දොලොව දියුණුව හා සතුට ලඟා කර ගැනීම පිණිස ඉවහල් වනු ඇත.

**01: දාන**

ආහාර, වස්ත්‍ර, නිවාස, බෙහෙත් හේත් ආදී මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ලෙස සැලකෙන, ශාසනික වශයෙන් ගත්කළ භික්ෂුවගේ චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන අවශ්‍යතාවන්ය. දාන විෂයෙහි පරිත්‍යාග කිරීම හෝ පූජාකිරීම කළ හැකිය. ඒවා අයත් වන්නේ ආමිෂ දානයටයි. මීට අමතරව අභය දාන හෙවත් ජීවිත නොනසා රැක ගැනීමට උපකාරී වීමත් සද්ධර්මයට අදාළ පරිත්‍යාග ධර්ම දානය ලෙසටත් හඳුන්වනවා.

**02: සීල සතුන් මැරීම**

සොරකම් කිරීම ආදි දස අකුසල්වලින් දුරුවී තුන්දොර සංවර කරගෙන පිළිවෙත් පිරීම සීලයයි.

**03: භාවනා**

සිත අපිරිසිදු කරන රාග, ද්වේශ, මෝහ ආදී කෙලෙස් යටපත් කිරිමට හා ප්‍රහාණයට හේතුවන කුසල සිතුවිලි වල පිහිටා සිත ඒකාග්‍රතාවයක පිහිටුවා ගැනීම භාවනාවයි.

**04: අපචායන**

උඩගු නොවී, මානයෙන් දුරුවී, ගුණධර්මවල පිහිටා තමාට කළ උපකාර පිළිබඳ සිහිකරමින් බුද්ධාදී උතුමන් හටත් දෙමව්පියන්ටත් ගුරුවරුන්ටත් ගෞරවයෙන් කරනු ලබන පූජා අපචායන නම් වේ.

**05: වෙයාවච්ච**

ගිලන්වූ අයට, වැඩිමහල් අයට ගුණවන්තයින්ට උවටැන් කිරීම වෙයාවච්ච ලෙස සැලකේ.

**06: පත්තිදාන**

අනුන් කෙරෙහි කරුණා සිතින් තමා කළ පින් ඔවුන්ට අනුමෝදන් කිරීම පත්තිදානය යි.

**07:පත්තානු මෝදනා**

යම් කිසි පුද්ගලයෙක් දානාදී පින්කම් කරන විට ඔහුගේ කුසල් මහිමයට ඊර්ෂ්‍යා නොකොට තමන්ද ශ්‍රද්ධාව උපදවාගෙන එම කුසල් අනුමෝදන්වීම පත්තානුමෝදනාවයි.

**08: ධම්ම සවණ**

ධර්මය අසා එය මැනවින් දරා එහිම හැසිරී තම ජීවිතය ලෞකික වශයෙන් ද ලෝකෝත්තර වශයෙන් ද යහපත් කරගෙන ඵල ලබාගැනීම ධම්මසවණ නම් වේ.

**09: ධම්මදේශනා**

ලාභ අපේක්ෂාවන්ගෙන් තොරව සත්හට මෙත් සිතින් යුතුව ධර්මය කියාදීම, ධම්ම දේශනා නම් වේ. මෙහිදි භික්ෂූන් වහන්සේ නමක් විසින් ගිහියන් උදෙසා පවත්වනු ලබන ධර්මදේශනා පිළිබඳව පමණක් අදහස් නොකෙරේ. භික්ෂු - භික්ෂූණී - උපාසක - උපාසිකා යන සිව් පිරිසෙන් කවුරුන් විසින් වුවද සිල්වත්ව ගුණවත්ව තමන් ධර්මයෙහි පිහිටා අනුන්ට කියාදීම ධම්ම දේශනා නම් පුණ්‍ය ක්‍රියාවට අයත් විය හැකිය.

**10: දිට්ඨුජ්ජුකම්ම**

දානාදී පුණ්‍ය ක්‍රියාවන්හි ඵලයක් ඇතැයි ආදි ලෙසින් සිතා, ධර්මයෙහි නියම තතු දැන සිත පිරිසිදු කරගෙන වාසය කිරීම දිට්ඨුජ්ජුකම්ම නම් වේ. දැක්මෙහි ඇති ඍජුභාවය හෙවත් චපල නොවූ ස්ථිර දැක්මක් තමා සතු බව සිතා සතුටුවීම මෙහි සරළ අදහසයි.

මෙවැනි පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙන බෞද්ධයා තමා කළ කී යහපත් දේ ගැන සිතමින් කාලය ගතකරයි. ඒ නිසා ඔහු මෙලොව සතුටු වන්නෙකි. මරණින් මතු ලබන්නා වූ ආත්ම භාවය ද මරණාසන්න මොහොතේ ඇතිවන කර්ම නිමිති හා ගති නිමිති අනුව යහපත් වන්නේය. මිනිසත්බව ලබා උපන් අප සැම මේ ලද අවස්ථාව ප්‍රයෝජනයට ගෙන කුසලයෙහි පිහිටා පුණ්‍ය ධර්ම රැස්කොට සැපසේ වෙසෙමු.

ශාස්ත්‍රපති
වික්‍රමසිංහ අතපත්තු

පසුගිය කලාපයෙන්...

# නොසැලෙන සිත



- **සංඥාව අවබෝධයෙන් නොසැලීම.**

මහණෙනි, "හඳුනාගනී" නුයි එයින් සංඥා යි කියනු ලැබේ. එනම් නිල්, කහ, ලේ, සුදු එනම් වර්ණ, හැඩය පාට යනාදී ලෙස හඳුනාගැනීමයි. අප කුඩා කාලයේ සිට රූපයන්ට විවිධ සංඥා දමා හඳුනාගෙන ඇත. පොල් ගස, ස්ත්‍රිය, පුරුෂයා, කොවුල් හඬ, පිච්ච මල් සුවඳ, පරිප්පු රස ආදී වශයෙන් පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහ ධාතුන්ගෙන් සෑදුන රූප වලට විවිධ නම් දමා ඇත. මෙසේ දමාගෙන ඇති සංඥා මිරිඟුවක් වැනිය. මිරිඟුවක් ඈතින් තියෙන බව පෙණුනත් ලඟට ගිය පසු එවැනි දෙයක් නොමැත. අප කුඩා කාලයේ සිට විවිධ දේ ඉගෙන ගන්නවා යනු රූප, වේදනා සහ විවිධ ක්‍රියාකාරීත්වයන් වලට නම් දමා සංඥා වශයෙන් ගොඩගසා ගැනීමකි. කථාකරන භාෂාව අනුව සිංහල, ඉංග්‍රීසි, දෙමළ යනාදී වශයෙන්ද අදහන ආගම අනුව මුස්ලිම්, බෞද්ධ, කතෝලික හින්දු, ඉස්ලාම් වශයෙන්ද, ජීවත්වන රට අනුව ඇමරිකාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව වශයෙන්ද, ඉපදුන කුළ අනුව ගොවිගම, කරාව, දුරාව, රදා, බෙර, හකුරු වශයෙන්ද සම්මුතිය තුළ සංඥා දමාගෙන හඳුනාගැනීම සිදුකරයි.

නමුත් සත්‍ය වශයෙන්ම සංඥාව මුසාවකි. උදාහරණයක් ලෙස තමන්ගේ ශරීරය කොටස් වශයෙන් වෙන් කළ විට, එතන එසේ නමක් දමාගත් කෙනා නොමැත. එමෙන්ම පොල් ගසක් කපා කොටස් කළ විට එතන එවැනි රූපයක් නොමැත. එමෙන්ම ශබ්ද, ගන්ධ, රස සහ ස්පර්ෂයන් සඳහා දමාගෙන ඇති සංඥාවන්ද සත්‍ය වශයෙන් නොපවතින දේ වෙයි.

- එමෙන්ම යමෙක් බනින විට තමන්ට තරහ යන්නේ එම පිටකරන වචන තමන්ට බනින වචන ලෙස සංඥා දාගෙන ඇති නිසාය. අපට නොතේරෙන භාෂාවකින් බැන්නොත් අපට තරහ නොයයි. මන්ද එම වචන වලට පෙර ලෙස සංඥා දමාගෙන නොමැති බැවිනි. එමෙන්ම තමන්ට හොඳ කියන විට ඒ අය සමඟ සුහද වේ. නමුත් නොතේරෙන භාෂාවකින් තමන්ට හොඳ කිවත් තමන් ගණන් නොගන්නේ, තමන් එම භාෂාවේ ශබ්ද හඳුනාගෙන නොමැති නිසාය. කෙනෙක් තමන්ට හොඳ කියන විට ඇලීමත්, බනින විට ගැටීමත් ඇතිවනවා නම් තමන්ගේ සිත සැලෙයි.

මෙලෙස සංඥා යනු මිරිඟුවක් මෙන් ඇත කියා පෙණුනත්, සත්‍යය වශයෙන් නොපවතින දෙයක් බව යථාභූත ඥාණයෙන් අවබෝධ කරගත් විට කිසිඳු සංඥාවකට නොසැලෙන සිතක් සාදා ගත හැකිය. සංඥාව සම්පූර්ණයෙන්ම නැතිකර ගැනීමේ දී සංඥා වේදයිත නිරෝධය හෙවත් නිරෝධ සමාපත්තියට පත්විය හැකිය.

- **සංඛාර අවබෝධයෙන් නොසැලීම.**

මහණෙනි, "සඞඛත කොට අභිසංස්කරණ කෙරෙත්" - (සඞඛතං අභිසඞඛරොන්ති) නුයි එයින් සංස්කාර යි කියනු ලැබේ. එනම් සකස්කරන ලද රූප, වේදනා, සංඥා, සංඛාර සහ විඤ්ඤාණය යලිත් යලිත් සකස් කිරීමයි.

සංඛාර මගින් සිදුවන්නේ රූපය රූපය පිණිසත්, වේදනාව වේදනාව පිණිසත්, සංඥාව සංඥාව පිණිසත්, සංඛාරය සංඛාරය පිණිසත්, විඤ්ඤාණය විඤ්ඤාණය පිණිසත් නැවත නැවත සෑදීමයි. යම් මලක් වැනි රූපයක් දෙස බලා සිටීමේදී, සිංදුවක් වැනි ශබ්දයක් අසා සිටීමේ

- දී, එය ලස්සනයිහොඳයි මැනවැයි යනාදී වශයෙන් සිතිවිලි ගොඩනගා ගනිමින් සංඛාර සාදයි.

අපගේ උප්පත්තිය පවා ඇතිවන්නේ සංඛාරයක් අල්ලාගෙනය. එය පුඤ්ඤාභි සංඛාරයක් නම් සුගතියකද, අපුඤ්ඤාභි සංඛාරයක් නම් දුගතියකද, අනෙඤ්ජාභි සංඛාරයක් නම් අරූපාවචර බ්‍රහ්ම ලෝකවලද උප්පත්තිය ලබයි. උප්පත්තියෙන් පසු දිගින් දිගටම කෙසෙල් කඳක කොල එක එක හදනවා මෙන් සංස්කාර පොදියක් සකස් කරයි.

උදාහරණයක් ලෙස පුංචි කාලේ බෝණික්කෙක්, ටොෆියක්, බෝලයක් වැනි දේවල් අල්ලාගෙන සංස්කාර සාදයි. ඉන්පසු අධ්‍යාපනය, රැකියාව, විවාහය, යුතුකම්, වගකීම් ආදිය අල්ලාගෙන සංස්කාර සාදයි. වයසට යන්න යන්න ධර්මය නොදන්නා කෙනාගේ සංස්කාර වැඩිය. ඒවායේම ඇලී ගැලී සිටී.

- එකින් එක සංස්කාර කෙසෙල් කඳක කොළ ගලවනවා මෙන් ඉවත් කළහොත් අරටුවක් නැති බඩයක් හමුවෙයි. ඒ ආකාරයෙන් හරයක් නැති දෙයක එතිලා ඇතිබව අවබෝධ වීමෙන් නැවත සංස්කාර නොසාදන තැනට චිත්තය පත්කර ගත හැකිය. එවිට සිත විසංඛාර බවට පත්වේ. එවිට නැවත තණ්හාවක් ඇති නොවේ. මෙය අවබෝධයෙන් කිසිඳු

එනම් එම දැනුවත් භාවයද මුසාවකි. එමෙන්ම රූප වේගයෙන් වෙනස් වන බැවින් දැනුවත්වීමද වේගයෙන් වෙනස් වේ. රූපය ජරාවට පත්වන නිසා විඤ්ඤාණයෙන් දැනුවත් වන්නේ ජරාවට යන රූපයකි. මෙසේ ඇතිවෙමින් නැතිවෙමින් යන විඤ්ඤාණය නැවත ඇති වුවත් අල්ලා ගන්නේ ජරාවට යන රූපයකි. එනම් විඤ්ඤාණය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව අවබෝධයෙන් නොසැලෙන

**සංඥා යනු මිරිඟුවක් මෙන් ඇත කියා පෙණුනත්, සත්‍යය වශයෙන් නොපවතින දෙයක් බව යථාභූත ඥාණයෙන් අවබෝධ කරගත් විට කිසිඳු සංඥාවකට නොසැලෙන සිතක් සාදා ගත හැකිය. සංඥාව සම්පූර්ණයෙන්ම නැතිකර ගැනීමේ දී සංඥා වේදයිත නිරෝධය හෙවත් නිරෝධ සමාපත්තියට**

**විඤ්ඤාණ අවබෝධයෙන් නොසැලීම.**

- මහණෙනි, "විජානනය කෙරේ" නුයි එයින් විඤ්ඤානය යි කියනු ලැබේ. එනම් රූප, වේදනා, සංඥා, සංඛාර පිළිබඳ දැනුවත්වීමයි.විඤ්ඤාණය යනු දැනුවත්වීමයි. මොනවාද දැනුවත් වෙන්නේ, වැනි හරයක් නැති, පෙණ ගොඩක් වැනි රූපය, දිය බුබුලක් වැනි වේදනාය, මිරිගුවක් වැනි සංඥාය, කෙසෙල් කඳක් වැනි සංඛාරයෝය. ඇත්තටම මෙසේ දැනුවත් වන්නේ නැති දේවල්ය. මායාවක ස්වභාවය වන්නේ නැති දේවල් සත්‍ය වශයෙන් පවතින බව පෙන්වීමයි. එසේ හෙයින් විඤ්ඤාණය මායාවක් ලෙස උපමා කොට ඇත. රූප දෙකක් එකතුවන විට විඤ්ඤාණය හටගනී.
- **"ද්වයං පටිච්ච විඤ්ඤාණං සම්භෝති".**
- රූප යනු ධාතු හතරකින් සෑදුනු දේවල්ය. පෙණ ගොඩක් සේ හර ශූන්‍ය රූප දෙකක් එකතුවී හටගන්නා විඤ්ඤාණයෙන් දැනුවත් වන්නේද හර ශූන්‍ය රූපයකි.

කල යුත්තේ යමක් දිහා බලාගෙන සිටියත්, යමක් අහගෙන සිටියත්, යමක් ආඝ්‍රාණය කරගෙන සිටියත්, යමක් රස විඳගෙන සිටියත්, යමක ස්පර්ශටයලබමින් සිටියත් යමක් මෙනෙහි කරමින් සිටියත්, කමින් බොමින් ඇවිදිමින් ආදී සෑම ක්‍රියාවක යෙදී සිටියත් ඒ සෑම සිතක ම මගේ කියා නොගෙන ස්වභාව ධර්මයේ ක්‍රියාවලියක් බව අඛණ්ඩව නුවණින් දැකීමයි. එවිට කෙදිනක හෝ වහා වහා ඔබගේ සිත සියල්ලෙන් නිදහස් වනු ඇත.

**පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි**

**නොදැනුවත්කමින් සිදුකළ යම් වරදකට සමාවදීම දේව ගතියකි.**

## ශාසනයේ ආශ්චර්ය ධර්ම අට

ඒ පින් මද පුද්ගලයා අතින් ඇද එළියට දමන තුරු බලා සිටියා නොවේදැයි වදාරා මුහුදේ මෙන් ශාසනයේද ආශ්චර්ය ධර්ම අටක් ඇති බවත් දක්වා "මහණෙනි, මින්මතු මම පොහොය නොකරමි, පාමොක් නො උදෙසමි, තෙපිම පොහොය කරවූ, පාමොක් ද උදෙසවු"යැයි ආඥා ප්‍රාතිමෝක්ෂෝද් දේශය පැණවූ සේක. ආශ්චර්ය කරුණු නම්,

1. මුහුද වෙරළ පටන් ක්‍රමයෙන් ගැඹුරුවනු මිස පටන් ගත් තැනම ගැඹුරු නොවේ. එසේම ශාසනයද ශීල, සමාධි, ප්‍රඥාවන් පිළිවෙලින් වඩා මිස එකවරම රහත් ඵලය වැනි ගැඹුර දැක්ක හැකි තැනක් නොවේ.

2. මුහුද කිසි කලෙක වෙරළ ඉක්මවා නොයන්නා සේ නියම භික්ෂුවද දිවිගියත් ශික්ෂා පද ඉක්මවන්නේ නැත.

3. මුහුද කිසි කුණපයක් නොතබා රළ වේගයෙන් ගොඩට ගසන්නා සේ දුශ්ශීල පුද්ගලයා ශාසනයෙන් ඉවත් කරනු ලැබේ.

4. නොයෙක් නම් ඇති ගංගාවන් මුහුදට පැමිණ මුහුද යන එකම නම ලබන්නා සේ නොයෙක් නාම ගෝත්‍ර ඇතියවුන් සසුනට වැද ශ්‍රමණ යන එකම නම් ලැබෙනුය.

5. කෙතෙක් වැස්සත් නැතත් මුහුදේ අඩු වැඩියක් නොපැමිණෙන්නා සේ කෙතෙක් දෙනා පිරිනිවන් නිවණේ අඩු වැඩියක් නොපෙනේ.

6. මුහුද එකම ලුණු රසයෙන් යුක්ත වනු සේමැ සුන එකම විමුක්ති රසයෙන් යුක්තය.

7. මුහුද මුතුමිණි ආදී රතනයන්ගෙන් යුක්ත වනවා සේම සසුන සද්තිස්බෝධිපාර්ශික ධර්මරත්නයන්ගෙන් යුක්තය.

8. මුහුද විශාල සත්වයන්ගෙන් යුක්තවන සේම සසුන මහා ශ්‍රාවකයන්ගෙන් යුක්තය.

මෙබඳු ආශ්චර්ය ධර්මයන්ගෙන් සැදුණ ශාසනය නිර්මලව පවතිනු සඳහා ආණා පාතිමොක්ඛුදෙද්සය පණවාලීමෙන් භික්ෂු භික්ෂුණී යන උභය ශාසනයට ස්ථිර පදනමක් වැටුණේය. මේ කාලය වන විට සංඝ සමාජය බෙහෙවින් වැඩි දියුණු වී තිබුණේය.

බුදු සසුන කෙරෙහි රාජ රාජ මහාමාත්‍යාදී බොහෝ දෙනා පැහැදීමෙන් අන්‍ය තීර්ථකයන්ගේ ලාභ සත්කාර පිරිහී යාම නිසා ලාභ අපේක්ෂාවෙන් සසුන් ගත අයද වූහ. එයින් වැඩියක් ශාසනාරූඪ පැණ නැගුණේය. සංඝ සමාජය පාලනයට තද බල නීති රීති අවශ්‍ය වූයේ එහෙයිනි.

ශික්ෂා පද හා විනය නීති පනවා පාලන බලය සංඝයා වෙතම පැවරූ බුදුන් වහන්සේ භික්ෂු භික්ෂුණී උභය සංඝ සමාජයේ අනුශාසකත්වය ගණනින් සිට පරිනිර්වාණ සමයේ සිට" යො වො ආනන්ද, මායා ධම්මෝච විනයෝච, වේසිතෝ පඤ්ඤෙතතෝ සො වො මමච්චයේන සත්‍ථා" යනුවෙන් ආනන්දය, මා විසින් තොපට යම් ධර්මයක් දෙසන ලද්දේ යම් විනයක් පණවන ලද්දේත් වේද, ඒ ධර්ම විනය දෙක මාගේ ඇවෑමෙන් තොපගේ අනුශාසකයා වන්නේය'යි වදාළ සේක.



# ශික්ෂාපද ප්‍රඥප්තිය

## ආශ්චර්ය ධර්ම අට

- මුහුද වෙරළ පටන් ක්‍රමයෙන් ගැඹුරුවනු මිස පටන් ගත් තැනම ගැඹුරු නොවේ. එසේම ශාසනයද ශීල, සමාධි, ප්‍රඥාවන් පිළිවෙලින් වඩා මිස එකවරම රහත් ඵලය වැනි ගැඹුර දැක්ක හැකි තැනක් නොවේ.
- මුහුද කිසි කලෙක වෙරළ ඉක්මවා නොයන්නා සේ නියම භික්ෂුවද දිවිගියත් ශික්ෂා පද ඉක්මවන්නේ නැත.
- මුහුද කිසි කුණපයක් නොතබා රළ වේගයෙන් ගොඩට ගසන්නා සේ දුශ්ශීල පුද්ගලයා ශාසනයෙන් ඉවත් කරනු ලැබේ.
- නොයෙක් නම් ඇති ගංගාවන් මුහුදට පැමිණ මුහුද යන එකම නම ලබන්නා සේ නොයෙක් නාම ගෝත්‍ර ඇතියවුන් සසුනට වැද ශ්‍රමණ යන එකම නම් ලැබෙනුය.
- කෙතෙක් වැස්සත් නැතත් මුහුදේ අඩු වැඩියක් නොපැමිණෙන්නා සේ කෙතෙක් දෙනා පිරිනිවන් නිවණේ අඩු වැඩියක් නොපෙනේ.
- මුහුද එකම ලුණු රසයෙන් යුක්ත වනු සේමැ සුන එකම විමුක්ති රසයෙන් යුක්තය.
- මුහුද මුතුමිණි ආදී රත්නයන්ගෙන් යුක්ත වනවා සේම සසුන සද්තිස්බෝධිපාර්ශික ධර්මරත්නයන්ගෙන් යුක්තය.
- මුහුද විශාල සත්වයන්ගෙන් යුක්තවන සේම සසුන මහා ශ්‍රාවකයන්ගෙන් යුක්තය.

## නවාංග ශාස්තෘශාසනය

සර්වඥයන් වහන්සේ අසහාය අනුශාසකවරයෙකු නිසා ම (සාසතීති සත්‍ථා) ශාසතා නම් වෙති. එහෙයින් උන්වහන්සේගේ අනුශාසනා ඇතුළත් ධර්ම විනය දෙක ශාසන නම් වෙයි. උන් වහන්සේ විසින් ම දක්වා ඇති පරිදි එය අංග නවයකින් යුක්ත හෙයින් නවාංග ශාස්තෘශාසන නම් වේ.

1. සුත්ත
2. සෙය්‍ය
3. වෙය්‍යාකරණ
4. ගාථා
5. උදාන
6. ඉතිවුත්තක
7. ජාතක
8. අබ්භූතධම්ම
9. වේදලල

යනු ඒ නවාංගයයි.

ධර්මය දෙසූ අය ශාසතෘ නම් වු අතර දෙසු දෙය ශාසන නම් වූ බව මෙයින් පෙනේ.

එය අසන්තෝ - අසා පිළිපදින්නෝ සාවක නම් වෙති. ඔවුහු භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා, වශයෙන් සතර කොටසක් වෙති. ගිහි පැවිදි වශයෙන් දෙපරිදි වූ එහි පැවැදි පිරිස ශ්‍රේෂ්ඨයි. එයිනුදු භික්ෂුහූ අග්‍රගණ්‍ය වෙති.

මෙහි පැවිදි පිරිස සංඝ නම් වන අතර මාර්ගඵල ප්‍රාපතයෝ ආර්ය සංඝ නම් වෙති. ආර්ය මාර්ගයේ පිළිපදින සෙස්සෝ සම්මුති සංඝයාය. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනයත් අතර පැවිදි පිරිසට විශේෂ වූ විනය හැරුණාම ඉතිරි සියල්ල හැමදෙනාටම පොදුය.

මෙසේ අනුශාසක වූ බුදුරජාණන් වහන්සේත් අනුශාසනය වූ ධර්මයත් අනුගාමිකයන් වූ ශ්‍රාවක සංඝයාත් යන තුණ් උත්තම රතන වශයෙන් සලකා සරණ යාමෙන් අරඹන බෞද්ධ ජීවිතය නිසි ලෙසට හැඩගසා නිසි මගට හරවා රිසි සැපට පමුණුවාලන්නේ යමකින් නම් එය බුඩ ශාසනය බව සැළකිය යුතුය.

පණ්ඩිත අමුණුගම හිමිරතන සහ කහටපිටිය ශ්‍රී ධීරානන්ද ස්ථවිරපාදයන් වහන්සේලා විසින් සම්පාදිත 2500 ජයන්ති ඉතිහාසය ග්‍රන්ථය ඇසුරිණි.

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

ශ්‍රී. බු. ව. 2563
වප් කලාපය
2019 ඔක්තෝම්බර්

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangiriprinters@gmail.com
වෙබ් අඩවිය: www.goldentemple.lk

# හොඳ මිනිසුන් ගොඩනගමු

බුදු දහමට අනුව පුද්ගල ජීවිතය උපත සහ විපත අතර විහිද කෙළවර වන්නක් නොවේ. සංසාරිකව ගලා යන පුද්ගල ජීවිතය කෙළවර වන්නේ නිවන් අවබෝධයෙනි.

නමුත් මේ බව පසක් කර ගෙන සිටින්නේ කව්රුන්ද? ත්‍රිපිටකය පුරාම දක්නට ලැබෙන විශිෂ්ඨ බුදුවදන් තුළින් සංසාරික ජීවිතයේ යථාර්ථය මෙන්ම පෙර ආත්ම භවයන් පිළිබඳවද තොරතුරු මැනවින් ප්‍රකාශිතය. පුනර්භවය, පටිච්ච සමුප්පාදය, කර්මය යන බුදුදහමේ මූලික ඉගැන්වීම් තුළින්ම පෙර හා පසු භවයන් පිළිබඳව කියැවෙයි.

අප මේ කරුණු සිහිපත් කිරීමට යොමුවන්නේ වර්තමාන ශ්‍රී ලාංකීය ජන සමාජයේ හැසිරීම දැක ඇතිවන චිත්ත සංවේගය නිසාය.

ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරවත් වයස් භේදයකින් තොරවත් පුද්ගල හා සමාජීය බෙදීම් වලින් තොරවත් දාන, ශීල, භාවනාදී පිංකම්වල යෙදෙමින් ප්‍රඥාව වැඩිදියුණු කර ගතයුතු ආකාරය බුදුදහම අපට උගන්වා තිබේ.

ගෘහය හෙවත් පවුල් ඒකකය සකසාගැනීමේ සිට මහා පරිමාණ සමාජයක් යහමඟට යොමු කිරීම දක්වා වන දාර්ශනික පසුබිම බුදුදහමින් අපට පෙන්වා දෙයි.


වසර 2500ක් පුරා ගොඩනැගුණු බෞද්ධ සංස්කෘතියකින් අප රට පොහොසත්ය. ඒ තුළ ජාති භේද, ආගම් භේද නැත. සංහිඳියාව සමානාත්මතාවද ඒ තුළ දක්නට ලැබෙයි. පරපුරෙන් පරපුරට සංස්කෘතිය සහ දේශජ ඥානය ගෙන යනු ලබන්නේ අධ්‍යාපනය මඟිනි. බෞද්ධ අධ්‍යාපන ක්‍රමය නම් යාව නිබ්බාන වූවකි. එයනම් නිවන් දක්නා තුරු අධ්‍යාපනය ලැබිය යුතු බවය.

මෙරට සමාජ, ආර්ථික, දේශපාලනික රටාවට ගැලපෙන පුරවැසියන් බිහිකිරීමෙහිලා අප තවමත් පසුගාමීය. සාක්ෂරතාව ඉහළ අගයක් ගත්තද ප්‍රායෝගික භාවිතයේදී මිනිසුන් තෙකරම් නූගත්දැයි හිතෙන ආකාරයේ පුවත් සුලභය. විපත්, අපරාධ, අනතුරු, වංචා, දූෂණ හා පරිසර විනාශයත් ඇතුළු මෙරට සිදුවන විවිධ තලයේ සිදුවීම් මගින් ඒ බව අපට පසක් වෙයි.

මෑත කාලයේ මෙරටින් වාර්තා වූ ඇතැම් අපරාධ ජාත්‍යන්තරයද මවිත කරවන සුළුවිය. සාමකාමී, දැහැමි මිනිසුන් සහිත යහපත් සමාජයක් බිහිකරගැනීමේ වගකීම වර්ථමානයේ දිවිගෙවන අප සතුය. නැතහොත් අනාගත පුරවැසියන් අපට වෛර කරනු, ද්වේශ කරනු නොඅනුමානය.

අපි නැවත ගමෙන් පංසලෙන් පාසලෙන් මෙරට සංවර්ධන ගමන ආරම්භ කළ යුතුව ඇත. දේශපාලන පරිවර්ථනයන් සිදුවූ තරමට සමාජ රටාව වෙනස් වන්නේ නැත. එය සැලසුම් සහගතව සහ අරමුණු සහගතව වෙනස් කළ යුතුය ඒ සඳහා යහපත් චේතනාවන් මෙන්ම පරිපූර්ණ මිනිසුන්ද යොදාගත යුතුය.

බුදුදහමේ පදනම එවන් උදාර මිනිසුන් බිහි කිරීමය. බුදුදහම ජනහදවත් වෙත ගෙනයාමේත් බුදු සසුන පෝෂණය කිරීමේත් වගකීම අප සැම සතු කාර්යභාරයකි.





# උතුම් නෑයෙකුවීමට නම්...

මිනිස් සමාජය පිළිබඳ පැහැදිළි අර්ථකතනයක් සිදුකළ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයා අප බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ "ඥාතීන් ගැන" කරුණු ඉදිරිපත් කළ අවස්ථාවකදී දේශනා කළේ විස්වාසා පරමාඥාතී" යනුවෙනි. මෙයින් අදහස් කරන්නේ විශ්වාසවන්තයා උතුම් නෑයා වන බවයි.

යමෙක් විශ්වාසය ආරක්ෂාවන පරිදි ක්‍රියාකරන්නේ නම් ඔහු උතුම් ඥාතියෙකු ලෙස සැළකිය හැකිවන බවයි මෙයින් ප්‍රකාශ වන්නේ. මෙයින් ගම්‍ය වන්නේ ඥාතියෙකුගේ ප්‍රධාන ලක්ෂණය වන්නේ "විශ්වාසවන්ත" කම ආරක්ෂා වන බවයි. සමාජයේ ජීවත්වන පුද්ගලයන් එකට බැඳ තබන (ජීවත්වන) ලණුව වන්නේ ඔවුන් නොවුන් අතර පවතින විශ්වාසනීයත්වයයි.

"පවුල" යන ඒකකය තුල ජීවත්වන ස්වාමියා බිරිඳ, දරුවන් යන අය අතර පැවතිය යුතු විශ්වාසය ඉතා වැදගත් වේ. ස්වාමියා තම බිරිඳ කෙරෙහි විශ්වාසයෙන් ක්‍රියාකළ යුතුය. බිරිඳ තම ස්වාමියා කෙරෙහි විශ්වාසයෙන් ක්‍රියාකළ යුතුය. දෙදෙනාට දෙදෙනා විශ්වාස බවෙන් තොරවූයේ නම් සිදුවන්නේ පවුලේ විනාශයයි. පවුලේ පිරිහීමක් මිස කිසි කලෙකත් දියුණුවක් ඇති නොවේ.

අන්‍යයන්ගේ වචන මගින්ද අවිශ්වාසය ඇතිවේ. ආයතනයක් ගත්විට එම ආයතන ප්‍රධානියා තම ආයතනයේ සේවය කරන සේවක සේවිකාවන් ගැන විශ්වාසය තැබිය යුතුය. සේවක සේවිකාවන්ද ආයතන ප්‍රධානියා ගැන විශ්වාසවන්තව ක්‍රියාකළ යුතුය. එවිට ආයතනයේ දියුණුවත් සේවක සේවිකාවන්ගේ දියුණුවත් නිරායාසයෙන් ඇතිවන්නේය.

ඈත අතීතයේ අප රටේ ඇතිවී තිබෙන විවිධ ජනප්‍රවාද වලින්ද අවිශ්වාසයේ විපාක දැනගත හැකිය. විශ්වාසනීයත්වය කොතරම් දුරට බලපෑවේද යන්න එවැනි තොරතුරු වලින් පැහැදිළි වේ.

ශ්‍රී ලංකාවේ රජකළ යසලාලකතිස්ස රජු තම රූපය හා සමාන වූ දොරටු පාලකයා සමඟ විශ්වාසය පදනම් කරගත් විහිළුවක් කළේය. එනම් සිහසුන දොරටු පාලකයාට දී තමන් දොරටු පාලක වෙසින් පෙනී සිටීමයි. දෙදෙනාගේම රූප සෝභාව එක සමානවිය. රජු දොරටුපාල වෙසින් පෙනී සිටියේය. දොරටුපාලකයා සිහසුන මත ඔටුනු දරා සිටියේය.

මෙසේ පෙනී සිටිය රජතුමා දොරටු පාලකයා සමඟ තිබූ මිත්‍රත්වය හේතුවෙනි. දොරටුපාලකයා කෙරෙහි රජු විශ්වාසය ඇතිකර ගෙන සිටියේය. මේ සිද්ධිය දන්නේ රජු හා දොරටු පාලකයා පමණි. රාජ සභාවට පැමිණෙන අය (මැති ඇමතිවරු) සිහසුන ම රජු මෙන් වෙස්වලා ගෙන සිටින දොරටුපාලකයාට වැඳ නමස්කාර කරති. මෙය දුටු (දොරටුපාලගේ වෙස්ගෙන සිටි) රජතුමාට හසිකුප්පාදය පහළ විය. (සිනාසුණේය)

අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් රාජ වෙස් ගෙන සිහසුණේ සිටි දොරටු පාලකයා සිනාසෙන (දොරටුපාල වෙස් ගෙන සිටි) රජු මැරවීමට නියෝග කළේය. එම නියෝගය මත යසලාකතිස්ස රජුගේ හිස සිඳීය. රජු දොරටු පාලකයාගේ ආකාරයට පෙනී සිටියේද දොරටු පාලකයා රජු ලෙස පෙනී සිටියේද දෙදෙනා අතරඇතිකරගත් විශ්වාසය" මතය. විනෝදය පිණිසය.

විශ්වාසය බිඳ දැමූ දොරටු පාලකයා රජු බවට පත්විය. මෙම ඓතිහාසික සිද්ධියෙන් පෙනී යන්නේ විශ්වාස කළ යුතු පුද්ගලයන් කවරෙක්දැයි බුද්ධිමත්ව සොයා බලා තෝරා ගැනීමයි. ශාරීරික අංග ලක්ෂණ වලින් සොයාගත නොහැකිය. ඇසුරෙන් හා ඔහුගේ ක්‍රියාකලාපයෙන් සොයාගත යුතුය.

විශ්වාසවන්තයාගේ එක් ලක්ෂණයක් වන්නේ විපතේදී අත්නොහැර ලඟින් සිටීමයි. තම මිතුරාගේ රහස් ආරක්ෂා කළයුතු නම් ඒවා ආරක්ෂා කිරීමද මිතුරෙකුගේ තවත් ලක්ෂණයකි. විශ්වාසය" බිඳීගිය තැන ඇතිවන්නේ විනාශයකි. එමඟින් පුද්ගල විනාශය පමණක් නොව සමාජයද විනාශයට පත්වන්නේය. විශ්වාසය බිඳීම නින්දාවට හේතු වන්නකි.

ලෝකයේ විවිධ ගැටුම් නිර්මාණය වන්නේද ඇතිවන්නාවූ "අවිශ්වාසය" පදනම් කරගෙනය. අන්‍යෝන්‍ය සුහදතාවය ඇතිවන්නේ විශ්වාසය ගොඩනැගුණු තරමටය.

විශ්වාසවන්තව ක්‍රියාකිරීම තුළින් සුන්දර ලොවක් නිර්මාණය කළ හැකිය. උතුම් ඥාතියෙකු ලෙස පෙනී සිටීමට නම් පළමුව තමා විශ්වාසවන්ත කෙනෙකු විය යුතුය.

ඒ සඳහා ඉහත සඳහන් "බුදු වදන" මෙනෙහි කරමු. ක්‍රියාවට නංවමු.

විජය තලවත්තේගෙදර

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.



## පණිහිඳ දකින ලඳ

දෙනුවන් නීල මිණි සඟවාගෙන    දිලෙන
දෙබැමින් මැවූ දේදුණු පෙන්නා    නැමුන
හසකැන් මුතු දසන් දක්වගෙන    නගන
කොපුලෙන් දෙළුම් ගෙඩි පෙන්නා ඈත    ඉදුන

සඟලෙන් දෙතොල් නාදලු මතුකර    තිබෙන
නලලෙන් නොයයි අඩසඳ දේදුණු    රකින
හිරවුන් ගෙලේ බැඳ ඈත හර උන්    බඳින
දෙසවන් පෙති දිලෙයි අභරණ කිති    කවන

තිසරැන් රුසිරු මතුකර තනියට    සිටින
උකුලෙන් පෙණෙන නාලිය යන ලැසි    ගමන
රන්වන් ඇඟිලිවල රන් අභරණ    දිලෙන
හිල්වන් කියොඹුවැල් දඟ නොකරයි    ගොතන

විලිකුන් රඹ කැනක පැහැයද වන    දෙවන
පිරිපුන් සිසි නිවුන් බව දක්වයි    උවන
සඳකැන් වැසුන කොඳවිල සරනා    පැමිණ
අඟනන් සුර නැවත යයි ඔබෙ රුව    දකින

තෙරුවන් වැඩ සිටින බුදු කුටියක    රැඳෙන
දෙවියන් සිටින නෙතුමානේ සිඟි    කරන
වදනින් මිණිකිකිණි සවනට දෙන    තිළිණ
කුටියෙන් වෙළඳ පෙණුනා සිරිකත    සිටින

කවියෙන් පිරු පත්ඉරු නුවණින්    බලන
රසයෙන් පිරුණ සාහිත දැනුමෙන්    නිපුන
දිරියෙන් පෙරට යන්නට ඔවදන්    පුදන
ඔබදුන් දිරිය අගයමි මම තෙක්    මියෙන

එම්.එම්. කුලසිරි ද සිල්වා - සමගිගම, කැකිරාව.

## මිතුරා හඳුනාගනිමු

සම්බුදු දහම වෙත සිත හිසි යොදන    විට
අප හට දැනෙයි මිතුරා යන පදය    තුට
විපතක් සිදුවිටදි අතහැර යනෙන    සෙට
අත්හැර දැමිය යුතු පවිටුන් පළමු    කොට

ලාභ ප්‍රයෝජන ලබනා තැන    සිටිනා
කළ ගුණදම් අමතක කර සිත    තුටිනා
අත්හැර යන්නේ තම සැප විහරණය    විනා
නැති දොස් පරොස් පවසයි සැමවිට    එහිනා

කොපමණ ගුණ දහම් දැන සිටියත්    ජනයා
ඒවා රකින බව නම් නැත එම    විනයා
හදවත් තුලින් මතුවෙන දුස් චරිත    යෙනා
කියවෙයි පවිටු සිතුවිලි ඔහුගේ    මුවිනා

කළණ මිතු දහම යලි ජන හද    රැඳීලා
එක්වනු මැනවි සැමවිට ජයමය    පතලා
රැකගන්නට සිතමු සමගියෙ මල්    ඉසලා
අතහැර නොයමු මිතුදම ගැන    සිතලා

අජන්තා ශිරෝමණී දිසානායක

## දුවට හා පුතුට

සැර වැර කෙරුවේ සෙනෙහස හින්දා
තරහ නොවන්න පුතේ
සැර වැර කෙරුවේ සෙනෙහස හින්දා
තරහ නොවන්න දුවේ
නොමග ගියොත් වාවනු බෑ මා හිත ඒකයි මා බැන
වැදුනේ
අමනාපයකින් නොවේ පුතේ
මනාපයකින් නොවේ දුවේ
ඇති දැඩි වී දැන තේරුම් යනතුරු මා නුඹලා පසු
පසමයි ඉන්නේ
නින්ද ගියත් මා නිදි නැති සිතුවිලි නුඹලා පසු පස
පියඹන්නේ
නරක යහළුවන් ඇසුරට යනවට අම්මගෙ හිත හොඳ
නැහැනෙ පුතේ
නරක යහළුවන් ඇසුරට යනවට පියාගෙ හිත හොඳ
නැහැනෙ දුවේ
පාසැල් ගොස් පොතපත කරවාගෙන දහම්
පාසැලෙන් ගුණය වඩාගෙන
මව්පිය නම්බුව හොඳට තියාගෙන අප තුටු කරන්
පුතේ, අප තුටු කරන් දුවේ
ඒකයි මව්පිය උපහාරේ...........

ශාන්ති මැණිකේ ජයවර්ධන

## සුදු නෑනයි පැලයි!

වැව් තාවුල්ල පෙණෙනා නෙපෙණෙන    මානේ
රවිමට දඹුවැටෙන් වටවී ඇති    හේනේ
සිව්දෙස බලන්නට පැල ලඟ අඩ    මානේ
නැව්වල කුඹගහක්වැනි ඉණිමඟ    ඕනේ


රැව්දෙන රාවයෙන් සිපද හඳ    පානේ
සෙව්වන්දියක් අමතන කියමින්    නෑනේ
විව්පත් පැදුර ඇයදුන් බව    අවසානේ
සිව්පදයෙන් කියයි පුන්සිසි දැක    මූණේ

අව්වැසි වෙහෙස නොතකා දවසක්    ගානේ
බිව් කිරිවල සවිය පෑ අතපය    වානේ
මාව් අස්වැන්න නෙලමින් නැකතට    නෑනේ
කොව්ලන් පරදවාපන් ඇව්දින්    හේනේ

පෙව් මදිරා පෙරා නුඹ පෙම්    කුසලානේ
දව්ලක් වයනවිට ඇයි නොදුටුවෙ    හීනේ
පව්ලක් වෙන්න හැදු ගෙපැලේ    ගම්මානේ
සෙව් කහවණු කුමට අටු පිරුනත්    නෑනේ

සිව්රඟසෙන් නොමැති නුඹ පෙම්    රජදානේ
දිව්රුම් දී ලඟියි මගෙ හද    සන්තානේ
ගෙව්යන් මැදින් එළිදක්වා මිණි    පානේ
හව්හරනෙට මගේ එනවද සුදු    නෑනේ

එම්.එම්.කුලසිරි ද සිල්වා
සමගිගම
කැකිරාව



# සසර සැඩ පහර

බුද්ධිමත් බෞද්ධයෝ බෝධිසත්වයෝ වෙති. සැම බුද්ධිමත් බෞද්ධයෙක්ම බුදුවිය යුතුය. මේ උතුම් මනුෂ්‍ය ආත්මභවය නම් වූ බෝධි සත්ව භූමියේ සම්බුදු සමයක උපන් අපට අර්හත්ත බුද්ධත්වය ලැබීමට අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත. ඒ පහසුකම් අතහැර පසෙකලා ලැබෙන බුදුබව මඟහැර මාන්නක්කාරකම පෙරටු කරගෙන රජකම, ඇමතිකම, අධිපතිකම, උගත්කම, ගුරුකම, වෙදකම, ගොවිකම, නිතිඥකම, නොයෙකුත් "කම්" කරගහගෙන ලෝක ධර්මයන් සොයාගෙන යයි. භෞතිකත්වයටම අගයදී එතැනම වැඳ වැටේ. එසේම අරහත්ත බුද්ධත්වය මාර්ගඵල නිවනෙන් ලැබෙන බුද්ධත්වය ලැබෙන ලොව්තුරු සැප නොසලකා හරී. මුදල් මත මෙහෙයවන පහත් මානසිකත්වය හෙවත් පුහුදුන් බව තුලම ජීවිතය ගොඩනැගීමට වෙහෙසෙයි. බුදුබව ලැබීමට පුහුදුන් මානසිකත්වයේ ආදීනව දැක ලොව්තුරු මග ඵල වල ආනිශංස අවබෝධයෙන් දැක අභිනිෂ්ක්‍රමණය කළ යුතුය.

සත්වයා කාමෝඝ භවෝඝ, දිට්ඨියෝඝ, නම් වූ දරුණු සැඩ පහරට අසුවී සසරට ගසාගෙන යයි. සැඩ පහර වළකා ලන්නේ කෙසේද? යන්න "ඕඝ තරණ සූත්‍රයෙන් බුදුපියාණන් වහන්සේ පැහැදිලි කර දුන්සේක.

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයක එක්තරා දිනක දේවතාවෙක් එතනට පැමිණ උන්වහන්සේට වැඳ නමස්කාර කර මෙසේ සැළකර සිටියේය.

- **කථන්නු තවං මාරිස ඕඝමතරීති**

නිදුකාණන් වහන්ස, ඔබ වහන්ස කෙසේනම් ඕඝ තරණය කල සේක්ද?

- **අප්පතිට්ඨං ක්වාහං ආවුසො අනායූහං ඕඝමක රීති**

ඇවැත්නි, මම නොපිහිටමින් වෑයම්ද නොකරමින් ඕඝය තරණය කෙලෙමි.

- **යථා කථං පන ත්වං මාරිස, අප්පතිට්ඨං අනායුහං ඕඝමතරීති**

නිදුකාණන් වහන්ස, නුඹ වහන්සේ කෙසේ නම් නොපිහිටමින් වෑයම්ද නොකරමින් ඕඝ තරණය කල සේක්ද?

- **යදා ස්වාහං ආවුසො සන්තිට්ඨාමි තදාස්සු සංසිදාමි. යදා ස්වාහං ආවුසො ආයුහාමි තදස්සු නිබ්බුය්හාමි එවං ඕවාහං ආවුසෝ අප්පතිට්ඨං අනායුහං ඕඝමතරිනති."**

ඇවැත්නි මම යම් විටක පිහිටා සිටිම්ද එකල්හි ගිලෙමි. අවැත්නි, මම යම් විටෙක වෑයම් කෙරෙම්ද එකල්හි ඉල්පයෙමි. ඇවැත්නි, මෙසේ මම නොපිහිටමින්ද වෑයම් ද නොකරමින් "ඕඝය" තරණය කෙලෙමි.

- **චිරස්ස වත පස්සාමි බ්‍රාහ්මණං පරිනිබ්බුතං අප්පතිට්ඨං අනායුහං තිණ්ණං ලොකෙ විසත්තිකං**

නොපිහිටමින්ද වෑයම් නොකරමින්ද ලෝකයෙහි තෘෂ්ණාව (ඕඝ) තරණය කල කෙලෙස් නැසූ ක්ෂිණාශ්‍රව බ්‍රාහ්මණයකු කලෙකින් දකිමි"

ඕඝ තරණය කිරීමේ ගැටළුව විසඳාගෙන සතුටු වූ සිත් ඇති දේවතාවා භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කර අතුරුදහන් විය. (සං. නි. දේවතා සං. ඕඝකරණ සූත්‍රය)

ලොව්තුරා දර්ශනය මත ඇලෙන්නේත් නැතිව සිටින්නේත් නැතිව යනු අන්ත දෙකට නොයාමයි. උපායශීලීව උපක්‍රමශීලීව නිසොල්මන්ව මධ්‍යම ප්‍රතිපදාවට අනුගතව රාග, දෝස, මෝහ ආදී කෙලෙස් ධර්ම හඳුනාගෙන දුරුකිරීමයි. ප්‍රතිපදාවක යෙදීමයි. ඒ සඳහා සතිමත්ව වාසයයි.

සියල්ල කරන්න කිසිවක් නොකරන්න. ආර්‍ය ශ්‍රාවකයාගේ ජීවන ප්‍රතිපදාවේ තේමා පාඨය විය යුතුය. සියල්ල කරන්න යනු නිසොල්මන්ව දඟලන්නේ නැතිව සිටීමයි. කිසිවක් නොකරන්න යනු මම පනවා නොගැනීමයි. මෙයයි ඕඝ තරණයේ ක්‍රමවේදය.

අවදිමත් සංසුන් මනසකින් සතිමත්ව ක්‍රියාශිලිව ඉවසිලිමත්ව සැම පහරෙහි බාධක දැක මඟහැර එගොඩවීමට පනින්න. පිහිටා සිටියහොත් කිඳා බැස මරණයට පත්වේ. ඕඝයේ සැඩ පරුෂ බවට බියට පත් වූවොත් දැඟලුවොත් භයෙන් තැතිගත්තොත් දුබල උනොත් ජල කඳෙහි වේගය දිසාව අවස්ථානුකූලව අවධාරණය නොකලහොත් දඟලලා වෙහෙසවී වතුර පෙවී ශරීර දුබලත්වයට පත්වී විනාශයට පත්වේ.

දරුණු සැඩ පහරෙහි වේගය දිසාව වහා වටහා ගැනීමේ නිසඟ හැකියාව තිබිය යුතුය. එවිට රළපහර මතින් සීරුමාරුවෙන් එගොඩවීමට හැක. අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව තිබිය යුතුය. එසේනම් එළඹ සිටි සිහියෙන් සැඩ පහර මඟහැර ඇගට නොදැනී එතෙරවීමට හැක. සසර ඕඝ තරණයේදී අන්ත දෙකක් අත්හල යුතුය.

ඕඝය තරණය කළ හැක්කේ ආක්‍රමණශීලීව නොවේ. උපායශීලීවය, ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය ආර්ය උතුමන් සසර ඕඝයෙන් එතෙරවීමට උපකාරි කරගත උපාය මාර්ගයකි. මේ ක්‍රමවේදයේ දි චෛතසික කෙලෙස් රාග, දෝස, මෝහ ක්‍රමයෙන් නිදහස් වේ. අමනසිකාරය වූ නිශ්ශබ්ද ගවේෂකත්වය කරා ලංවීමට නම් මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ජීවිතය විඳවන්නේත් නැති ජීවිතය විඳින්නේ නැති අන්ත දෙකින් මුදවා ගත යුතුය.

මේ අවස්ථා දෙකම ඉක්මවා යන්නේ ඕඝතරණයෙන් පසුවයි. මාර්ගයෙන් ඉදිරියට යාමට ගමනේ අවසානය සඳහා අමුතු දුක්ඛ පටිපදා වෙර වීර්ය කිරීමක් බුදු පියාණන් වහන්සේ අනුදැන වදාරා නැත. ඇත්ත ඇති සැටියෙන් දැකීමේදී ලෝකයේ මූල ස්වභාවය හෙවත් යථාභූත ඥාණ දර්ශනයේදී පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාශ, විඤ්ඤාණ ශුද්ධ ධර්ම වල ඇති තතු ස්වභාවය, ප්‍රකෘතිය, ක්‍රියාකාරිත්වය මැනවින් දැනගත යුතුය. අවබෝධ කටයුතුය. තත්වාකාරයෙන් අවධාරණය කල යුතුය. එයයි පූර්වකෘත්‍යය වන්නේ.

සත්වයා යනුවෙන් සම්මුතිව ප්‍රඥප්තිව පනවාගෙන නම්කර ගෙන ව්‍යවහාරයේ ඇති මේ ස්වභාව ධර්මය යථාර්ථය ගැඹුරින් අධ්‍යයන කරන්න. සවිඥානකත්වය හෙවත් විඤ්ඤානයාගේ ක්‍රියාකාරිත්වයේ ඉදප්පච්චයතාවය අවධිමත් මනසින් අධ්‍යනය කරන්න. ශුද්ධ ධම්ම හෙවත් ශක්තිවල ස්වභාවය පටිච්චසමුප්පන බව මැනවින් හැදෑරීමෙන් මතකය අවදි කිරීමෙන් ප්‍රකෘතිය කරා මන මෙහෙය විය හැක.

මහා භූත නම් වූ පඨවි ආදී ශක්ති සමූහය මූල ස්වභාවය සාමුහිකත්වයයි. වෙන් නොවන ස්වභාවයයි. වෙනස්වීම චලනය පටිච්චසමුප්පන්න භාවයේ යථාර්ථයයි. සාමූහිකත්වය පදනම්ව විද්‍යාමානවන නිසා පුංජයක් වශයෙන් ඝනීභූත භාවයෙන් ප්‍රකට වේ. ප්‍රකටවීම "රූප" නමින් සම්මුති නාමය ලෝක ව්‍යවහාරයේ මුලින්ම නම් කිරීම වේ.

මහා භූතයන්ගේ "රූප" සංඥාව දුරුකිරීම සඳහා පදාර්ථයන්ගේ (ශක්ති සමූහයේ) පටිච්ච සමුප්පන්නතාවයෙන් ශූන්‍යත්වය ස්වභාවයට පත්වීම ගැන අවබෝධ කටයුතුය.

1. පඨවි ධාතුව

සංඥා වශයෙන් ගත්විට තද ස්වභාවය දරදඬු බව කැඩෙන ගතිය, දැනෙන ගතිය, ප්‍රකෘතියයි. පඨවි නම් ශක්තියේ පදනම ඇතිවීම නැතිවීම සාපේක්ෂතා ධර්මතාවයම වේ. එනිසා ස්වක්‍රියත්වයක් පැනවිය නොහැක. ඇත කියා දැක්වීමට හෝ නැත කියා දැක්වීමට හෝ පැනවිමට කිසිසේත් ඉඩක් නැති සාධාරණ සාධක නැති භාව, අභාව නොපැනවිය හැකි ස්වභාවයකි.

පඨවි ධාතු වශයෙන් සංඥා විරහිත භාවයට හෙවත් සංඥා නොවන තැනට මන ක්‍රියාකර අමනසිකාරය නම් ධර්මතාවයට පත්වී

විය හැක.

මහා භූත නම් වූ පඨවි ආදී ශක්ති සමූහය මූල ස්වභාවය සාමූහිකත්වයයි. වෙන් නොවන ස්වභාවයයි. වෙනස්වීම චලනය පටිච්චසමුප්පන්න භාවයේ යථාර්ථයයි. සාමූහිකත්වය පදනම්ව විද්‍යාමානවන නිසා පුංජයක් වශයෙන් ඝනීභූත භාවයෙන් ප්‍රකට වේ. ප්‍රකටවීම "රූප" නමින් සම්මුති නාමය ලෝක ව්‍යවහාරයේ මුලින්ම නම් කිරීම වේ.

මහා භූතයන්ගේ "රූප" සංඥාව දුරුකිරීම සඳහා පදාර්ථයන්ගේ (ශක්ති සමූහයේ) පටිච්ච සමුප්පන්නතාවයෙන් ශූන්‍යත්වය ස්වභාවයට පත්වීම ගැන අවබෝධ කටයුතුය.

1. පඨවි ධාතුව

සංඥා වශයෙන් ගත්විට තද ස්වභාවය දරදඬු බව කැඩෙන ගතිය, දැනෙන ගතිය, ප්‍රකෘතියයි. පඨවි නම් ශක්තියේ පදනම ඇතිවීම නැතිවීම සාපේක්‍ෂතා ධර්මතාවයම වේ. එනිසා ස්වක්‍රියත්වයක් පැනවිය නොහැක. ඇත කියා දැක්වීමට හෝ නැත කියා දැක්වීමට හෝ පැනවීමට කිසිසේත් ඉඩක් නැති සාධාරණ සාධක නැති භාව, අභාව නොපැනවිය හැකි ස්වභාවයකි.

පඨවි ධාතු වශයෙන් සංඥා විරහිත භාවයට හෙවත් සංඥා නොවන තැනට මන ක්‍රියාකර අමනසිකාරය නම් ධර්මතාවයට පත්වී (මෙනෙහි නොවන තැනට) සංඥාවන්ගේ නිරෝධය නම් වූ නිරෝධ සංඥා ධර්මතාවය ප්‍රකට කිරීම සිදුවේ. ඒ අවස්ථාව අව්‍යාකෘතයි. පෙන්විය නොහැකි පැනවිය නොහැකි ස්වභාවයකි. චේතනා විරහිත බවකි. එම නිසා පඨවි ධාතුව පදාර්ථයේදී ශූන්‍යත්වයේදී සංඥා විරහිත වේ. මේ පදානුගතානු සාරයෙන් මේ ක්‍රමවේදයෙන් සියලුම ධාතුන්ගේ යථාර්ථය නුවණැසින් පැහැදිළි කර ගත යුතුය. යම් කෙනෙක් ගැඹුරු ස්කන්ධ, ධාතු ආදී පදාර්ථයන්ගේ යථාර්ථය විදර්ශනා නුවණින් ගැඹුරින් යථාවත්ව ඇත්ත ඇති සැටියෙන් ප්‍රඥාවෙන් විනිවිද දී ද එවන්නන් දුර්ලභ බව බුදුපියාණන් වහන්සේ පෙන්වා දෙති. නිමිති ගැනීමේදී සංඛාර වේ. අනිමිත්තයේ විසංඛාරයි.

**2. ආපෝ ධාතුව -**

ගලායන, වැගිරෙන, දියවෙන, පාවියන ඉලිප්පීයන, ඔසවාගෙන යන, ඩැහැගෙන යන ස්වභාවයයි. පටිච්චසමුප්පාද හෙවත් ඇතිවීම, නැතිවීම මූලධර්මයට පදනම්ව ඇතිබව හෝ නැතිබව සංඥා ගැනීමට නොහැකි නිසා සංඥා සූන්‍යත්වයට පත්ව අචින්තයෙන් අනිමිත්තයට පත්වේ. (පඨවි ධාතුව ගැන ගෙනහැර දැක්වූ කරුණු මීටද අදාල වේ)

**3. තේජෝ ධාතුව**

ශක්තිය, උණුසුම, ශීත ස්වභාවය, දිරවන, දවාලන, පුච්චන ගතිය ප්‍රධානයි. තේජෝ ශක්තියද ස්වය ඕහු ජනිත නිසා පටිච්ච සමුප්පන්න ධර්මතාවයට යටත්ය. ඇති බවත් නැති බවත් සාපේක්ෂව වෙනස් වන නිසා නිත්‍ය වශයෙන් ඇත හෝ නැත ස්වභාවය පැනවිය නොහැකි බැවින් සංඥා නිරෝධයෙන් සූන්‍ය වේ.


**4. වායෝ ධාතුවේ ස්වභාවය**

හමායන බව, පීඩනය, තෙරපුම, පිම්බීම, හැකිලීම ඔසවාගෙන යාම, පෙරටුකොට ඇත. මෙම ධාතුවද ඉහත දැක්වූ ධාතුන්ගේ ධර්මතාවයට යටත් නිසා පටිච්චයේ දී සූන්‍යවන නිසා ඇත නැත යනුවෙන් ගැනීමට නොහැකි නිසා නිමිති විරහිතයි.

ධාතු හතරේ සිතිය නොහැකි කිව නොහැකි මැනබැලිය නොහැකි ස්වයම්භූ චලනයක් වේගයක් සාමූහිකව සිදුවන නිසා පුංජයක් ගොනුවක් පිඩක් වශයෙන් විද්‍යාමාන ස්වභාවයට රූපයයි සම්මුතිය දී ඇත.

එය එනම් රූපය ආකාශ ධාතුව තුල ස්ථානගත වීම වේ. සීමා මායිම් වේ. ආකාශ ධාතුවද ශක්තියකි. පටිච්ච සමුප්පන්න ධර්මතාවයට එයද යටත්ය. ඇතිවිම නැතිවීම සාපේක්ෂතාවය ඊට ද අදාලය. එහිදී ආකාශ ධාතුවද ප්‍රකට බවේ හිස් ඉඩකඩ තුල කිසිඳු සංඥාවක් ප්‍රකට නොවේ.

විශ්ව ව්‍යාප්ත ආකාශ ධාතුව තුල සතර මහා භූත නම් වූ ශක්ති සමූහය පටිච්ච සමුප්පන්න වන බැවින් රූප මතුවේ. එම රූප අභ්‍යන්තර බාහිර රූප වශයෙන් ඝනීභූත වී පුංජයක් වශයෙන් විද්‍යාමාන වේ. මේ ස්වභාව ධර්මතා දෙක හෙවත් අභ්‍යන්තර රූප බාහිර රූප සම්බන්ධිකරණය වීමේදී විඤ්ඤානය නම් ශක්තිය ප්‍රකට වේ. මේ සියල්ල ඉදප්පච්චයතාව හෙවත් පටිච්ච සමුප්පන්න



ධර්මතාවයට යටත්ය.

සබ්බේ ලොකො චලිතො
සබ්බේ ලොකො පජ්ජලිකො

සියලු ලෝක ධර්මතා චලිත වේ. සියලු ලෝක ධර්මතා දිදුලයි.

සම්බුද්ධ දේශනාවන්, සම්මුති දේශනා පරමාර්ථ දේශනා වශයෙන් දෙකොටසකි. ඉහත සඳහන් දහම් කරුණු පරමාර්ථ දේශනා හා සම්බන්ධ වේ. එය ප්‍රඥාවට ගෝචර වේ. සියලු හටගත් දේ භෞතිකත්වයෙන් ඔබ්බට ගිය පසු ඉක්මවා ගියපසු පරමාර්ථ වශයෙන් ප්‍රකාශිත වේ.

**"දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ**
**රුප්පතීති රූපෙසු ජනා පමත්තා**
**තස්මා තුවං පිගිය ආසමත්තා**
**ජහස්සු රූපං අපුනබ්භවාය"**

**රූපය නිමිති වශයෙන් ගෙන රූපය උපාදාන කරගෙන රූපයෙහි මත්වන මිනිසා රූපයේ ධර්මතාවය හේතුකොට ගෙන වෙහෙසට පත්වේ. දුකට පත්වේ. වැනසීමට පත්වේ.**

ඒ ධර්මතාවය අනිදස්සතා විඤ්ඤානය යනුයෙන් තථාගත භාෂිතයෙහි වේ. එය අනිත්ත, අප්පනිහිත, සුඤ්ඤත නම් ද ව්‍යවහාර වේ. භෞතික මානසිකත්වයට ගෝචර නොවේ.භෞතිකත්වය මත විස්තර කරන රූපයේ යථාර්ථය විදසුන් නුවණින් දකින ලෙස සුත්ත නිපාතයේ පරායන වග්ගයේ පිංගිය සූත්‍රයෙහි මෙසේ දැක්වේ.

"දිස්වාන රූපෙසු
විහඤ්ඤමානෙ
රුප්පතීති රූපෙසු ජනා
පමත්තා
තස්මා තුවං පිගිය
ආසමත්තා
ජහස්සු රූපං
අපුනබ්භවාය"

රූපය නිමිති වශයෙන් ගෙන රූපය උපාදාන කරගෙන රූපයෙහි මත්වන මිනිසා රූපයේ ධර්මතාවය හේතුකොට ගෙන වෙහෙසට පත්වේ. දුකට පත්වේ. වැනසීමට පත්වේ.

එම නිසා පිංගිය ඔබ රූපයේ යථාර්ථය දැක එහි මත්නොවී අනිත්‍යතාවය පටිච්චසමුප්පන භාවය විදසුන් නුවණින් දකිමින් පුනර්භවයකට යාමට හේතු කාරක දුරු කරන්න. රාධ සංයුක්තයේ සත්ත සූත්‍රයේ මේ හා සමාන ධර්මවිවරණයක් ඉදිරිපත් කරන්න.

රාධ තෙරුවන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ විචාරති. ස්වාමීනි, සත්ත යයි කියනු ලැබේ. සත්ත යනු කුමක්ද? රාධ, රූපයෙහි ඇලීමක් එහි සතුටක් ආශාවක්, කැමැත්තක්, දැඩිව අල්ලාගත් බවක් පෙන්නුම් කරයිද ඒ සත්ත නම් වේ.

එමෙන්ම රාධ, වේදනාවේ ඇල්මක් එහි සතුටක්, ආශාවක්, කැමැත්තක්, දැඩිව අල්ලාගත් බවක් පෙන්නුම් කරයිද, ඒ සත්ත නම් වේ. මේ අයුරින් සංඥා සංඛාර, විඤ්ඤාන ස්කන්ධ පංචකය සම්බන්ධයෙන් සතුටක්, ආශාවක්, කැමැත්තක්, දැඩිව අල්ලාගත් බවක් පෙන්නුම් කරයිද ඒ සත්ත නම් වේ.

රාධ කුඩා දරුවෝ වැලි වලින් ගෙවල් සාදා ක්‍රීඩා කරති. පහව නොගිය ආශාවන්ගෙන් යුක්තවේ. පහව නොගිය කැමැත්ත ඇතිව සිටිති. ප්‍රේමයෙන් පිපාසිත වෙති. ලොල් වෙති, වස්තු කොට ගනිති. ධනය කොට සලකති. මමත්‍වය ගොඩ නැගේ. යම් දවසක මෙහි යථාර්ථය දැනගත් දිනක සියල්ල කෙරෙහි ආශාවෝ පහවෙති. ප්‍රේමය, ආදරය, වුවමනාව, කැදරකම, ඇල්ම, ආශාව, ගිජුකම ඉවත්වී යයි. ක්‍රීඩා කිරීමේ කැමැත්ත නැතිවේ. එසේ රාධ, රූපයාගේ යථාර්ථය දැක විසුරුවා හරින්න. තණ්හක්ඛයෝ රාධ නිබ්බාණන්ති"

ගම්පහ සිරිසීවලී හිමි

# වේඛනස්ස සූත්‍රය ඇසුරින් නිවන් මගට...



තුන් ලොවක් දහම් අමා වස්සවා සැනසූ ලෝකනාථයන් වහන්සේ ගම් දනව් සිසාරා දිවා රාත්‍රී දෙකෙහි ලෝසත සනසමින් වඩින ගමනේ දිනක් දම් අමාව ලබන්නට වේඛනස්ස බ්‍රාහ්මණයාද පුණ්‍යවන්ත විය.

එදා සම්බුදුරජාණෝ වැඩ වාසය කළේ සැවැත්නුවර ජේතවනාරාමයේය. ජේතවනාරාමයට සපැමිණි වේඛනස්ස බ්‍රාහ්මණතුමා බුදුරජාණන් වහන්සේට වැඳ නමස්කාර කොට පසඟ පිහිටුවා හිඳ ගත්තේය. එසේ හිඳගත් එතුමා බුදුරදුන් ඉදිරිපිට "මෙයයි පරම වර්ණය, මෙයයි පරම වර්ණය" යනුවෙන් උදානයක් කළේය.

මෙයට සවන් යොමු කළ සම්බුදුරජාණෝ වේඛනස්ස දැන් ඔබ කුමක් කරණ කොටගෙනද "මෙයයි උත්තම වර්ණය" යනුවෙන් ප්‍රකාශ කළේ, ඔබ දකින ආකාරයට උත්තම වර්ණය කුමක්දැයි විමසීය. වේඛනස්ස පිළිතුරු වශයෙන් "භවත් ගෞතමයෙනි, යම් වර්ණයකට වඩා ඉතා උත්තරීතරවූත් ප්‍රණීතවූත් වර්ණයක් ඇද්ද එය තමයි උත්තම වර්ණය යනුවෙන් පැවසීය.

කච්ඡායන, යම් වර්ණයකට වඩා ඉතා උත්තරීතර වූත් ප්‍රණීතවූත් යම් වර්ණයක් ඇත්නම් ඒ වර්ණය කුමක්දැයි බුදුහිමි නැවතත් විචාලේය. ඔහු නැවත මුලින් ප්‍රකාශ කළ ප්‍රකාශයම කළේය.

වේඛනස්ස, ඔබ මේ කරන ප්‍රකාශයට කිසිම අර්ථයක් නැහැ නේදැයි සම්බුදුරජාණෝ විමසන කල්හි නැවතත් වේඛනස්ස මුලින් කී දේම පිළිතුරු වශයෙන් පැවසීය. එවිට තථාගතයාණෝ වේඛනස්සගේ කියමනට නිර්වචනය කිරීමක් උපමාවක් තුළින් පැහැදිළි කළහ.

"එක්තරා පුද්ගලයෙක් මෙහෙම කියනවා මේ ජනපදයෙහි යම් ජනපද කල්‍යාණියක් සිටිනවා මං ඇයට කැමතියි. මං ඇයට කැමතියි කියා ඔහු පවසනවා. මෙය අසා සිටින අයෙක් ඔහුගෙන් විමසනවා. එම්බා පුරුෂය, ඔබ යම් ජනපද කල්‍යාණීයකට රුචි වන්නේද, කැමති වන්නේද ඇය ක්‍ෂත්‍රිය වංශික කුමරියක්ද, පැමිණි කුමරියක්ද, සිටු කුමරියක්ද නැතහොත් ශුද්‍ර කුල කතක්දැයි ඔහු විමසීය.

ඒ ගැන මා නොදනිමියි ඔහු පැවසීය. අර පුද්ගලයා නැවත ඔහුගෙන් විමසනවා "එම්බා පුරුෂය, ඔබ යම් ජනපද කල්‍යාණියකට රුචිද කැමතිද, ඇය කිනම් නමකින් ගෝත්‍රයකින් හඳුන්වන්නේද?" එයද නොදන්නා බව ඔහු පවසනවා.

එසේනම් පුරුෂය ඒ කත කළුද, තලෙලුද, රන්වන් පාටද, උසද මිටිද වශයෙන් ඔබට කිවහැකිදැයි විමසීය. එයත් නොදන්නා බව ඔහු පවසයි. අඩුම තරමේ කිනම් නගරයක, ගමක, වීථියක ඇය වාසය කරන්නේදැයි දන්නවා ද? එයත් නොදන්නා බව ඔහු පවසයි.

එවිට එම්බා පුරුෂය ඔබ ජනපද කළ්‍යාණියකට කැමති වන්නේද, රුචි වන්නේද ඈ ගැන කිසිවක් නොදන්නේ නම් ඔබ කැමතිවූයේ රුචි කළේ කුමකටද? යනුවෙන් විමසනවා. වේඛනස්ස, මේ කරුණ ගැන ඔබ සිතන්නේ කුමක්ද? කරුණු මෙසේනම් ඒ පුද්ගලයාගේ කියමනට අර්ථයක් තිබේද? මෙය කිසි වැඩකට නැති හිස් දෙයක් බවට පත්වන්නේ නොවේද?

භවත් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන්ම කරුණු මෙසේ නම් ඒ පුද්ගලයාගේ කථාව කිසිවැඩකට නැති හිස් දෙයක්ම බව වේඛනස්ස පිළිතුරු දිනි. වේඛනස්ස ඔබේ මේ ප්‍රකාශයත් මේ වගේමය. ඔබ කියනවා "භවත් ගෞතමයෙනි, යම් වර්ණයකට වඩා ඉතා උත්තරීතරවූත් ප්‍රණීතවූත් වර්ණයක් නැද්ද එය තමයි උත්තම වර්ණය කියලා" නමුත් ඒ වර්ණය කුමක්දැයි ඔබ පවසන්නේ නෑ.

එවිට වේඛනස්ස පවසන්නේ භවත් ගෞතමයෙනි, ඉතා සුන්දර වූ, අලංකාරවූ, අටපට්ටම්වූ, මැනවින් ඔප දැමූ වෛරෝඩි මාණික්‍යයක් රතු පලසක තිබෙද්දී බබලනවා නම් විශේෂයෙන් බබලනවා නම් දිළිසෙනවා නම් අන්න එබඳු වූ ආත්මය මරණින් මතු පවතිනවා යැයි වේඛනස්ස ගේ පිළිතුර විය.

හොඳයි පින්වත් වේඛනස්ස මා දෙසන දේ මැනවින් අසා පිළිතුරු දෙන්න ඉතා සුන්දර වූ කාන්තිමත් වූ අටපට්ටම්වූ මැනවින් ඔපමට්ටම් කළ වෛරෝඩි මාණික්‍යයක් රතු පලසක තිබෙද්දී බබලන් නේ යම්සේද වඩාත් බබලන්නේ යම්සේද ඒ වගේම මහා සණ අඳුරක යම් කණාමැදිරියෙක් දිලිසෙනවා නම් මේ දෙකෙන් වඩාත් බබලන්නේ කුමක්දැයි බුදුහිමි විචාලේය.

"ස්වාමීනි, කණාමැදිරියාගේ එළිය යැයි වේඛනස්ස පැවසීය".

එය එසේනම් පින්වත, රාත්‍රී සණ අන්ධකාරයේ බබළන කණාමැදිරි ආලෝකයත් එම අඳුරේම දැල්වූ පහන් එළියක් ගත් කල්හි කුමක් බබලයිද?

"ස්වාමීනි පහන් ආලෝකයයි."

සණ අඳුරේ දැල්වූ පහන් එළියත් දැල්වෙන ගිණිගොඩත් ගත් කල්හි වඩාත් ආලෝකමත් වන්නේ කුමක්ද?

"ස්වාමිනි ගිණිගොඩය"

රාත්‍රි සණ අඳුරේ දිලිසෙන ගිණිකඳන් වළා රහිත අහසේ බැබලෙන ඕසධී තාරකාවත් ගත් කල්හි කුමක් සුන්දර ලෙස ප්‍රණීත ලෙස බබලයිද?

"ස්වාමිනී තාරකාවය"

වළා රහිත අහසේ බබලන ඕසධී තාරුකාවත් පසළොස්වක පොහොය දින පායන පුන් සඳත් ගත් කල්හි වඩාත් සුන්දරව ප්‍රණීතව බබලන්නේ කුමක්ද?

15 පිටුවට...

ශාස්ත්‍රවේදී වත්තේගම කුසලධම්මා මෙහෙණින් වහන්සේ


පන්සිය පනස් ජාතක කථා පොත ඇසුරෙනි
වණ්ණුපථ ජාතකය
ඒ... නගරයට සේන්දු වූ බෝසත් වෙළෙඳ තෙම.. සිය ගැල් පන්සියයේ තිබූ භාණ්ඩ විකුණා මහත් ලාභයක් ලැබුවේය...
එසේ.. බඩු වෙළෙඳාම්... කර ගත් බෝසත් වෙළෙඳ තුමා ඇතුළු පන්සියයක් පිරිස. තම ගැල් පන්සියයක් සමඟ ආපසු ඔවුන්ගේ ගම්. බිම් බලා යාමට පිටත් වූහ...
මෙසේ.. වණ්ණුපථ ජාතක කථාව නිමා කළ බුදුන් වහන්සේ....
“මහණෙනි” කාන්තාරයේ.. අතරමං වී.. සැම දෙනා ජීවිත ආශාව අතහැර සිටින විට... එකල වෙළඳ නායකව මගේ කීම අසා.. දැඩි සේ.. වීරිය ගෙන ගල් තලාව බිඳ දැමූවේ.. දැන් වීරිය අත්-හැර සිටින මේ භික්ෂුවයි....
එකල... වෙළෙඳ නායකයාණනි.. බුදුවූ මම ම වෙදැයි වදාළ සේක...
මේ.. ජාතක කථාව ඇසූ.. එම භික්ෂුව සිතට දැඩි වීරිය ගෙන භාවනා කර රහත් භාවයට පත්වීය...
නිම
-සැකසුම හා චිත්‍ර
-පාලිත- සරූ ආරච්චි

13 පිටුවෙන්....

"ස්වාමිනී පුන්සඳය"

පසළොස්වක පොහොය දිනයේ වළා රහිත අහසේ දිලිසෙන පුන්සඳක් මධ්‍යන කාළයේ පායන හිරු මඩලත් ගත් කල්හි වඩාත් සුන්දරව ප්‍රණීතව බබලන්නේ කුමක්ද?

"ස්වාමිනී, රන්වන් හිරු මඩලය"

එසේ නම් වේඛනස්ස කණාමැදිරි එළියටත් වඩා ඉතා හීනවූ ඉතා ලාමකවූ වර්ණයකට නේද ඔබ උත්තම වර්ණයැයි කියන්නේ. එසේම ඍජුවම එය කුමක්දැයි කියාද ඔබ නොකියයි.

පින්වත, මම ඔබට පැහැදිලි කර දෙන්නම් කාමගුණ 5ක් තිබෙනවා. ඒ තමයි ඇසින් දකින රූප, කණින් අහන ශබ්ද, නාසයෙන් ගන්නාවූ ගඳ සුවඳ, දිවින් ගන්නාවූ රස, ශරීරයෙන් ගන්නාවූ ස්පර්ශ, මේවා කරණකොට ගෙන සත්වයා ඒ රූපාදී අරමුණු ඉෂ්ඨ වූ කාන්තවූ මනාප වූ ප්‍රිය ස්වභාව ඇති කාමාශාව ඇතිවෙන කෙළෙස් ඇතිවෙන අරමුණු ගෙන සත්වයා කාමගුණයට පත්වේ.

එහෙත් වේඛනස්ස මේ පංචකාම ගුණය කරණකොට ගෙන සොම්නසක් ඇති වෙනවා නම් ඒකට කියනවා කාමසුඛය කියලා. කාම සුඛය ඇතිවෙන්නේ කාමයන් කරණ කොට ගෙන කාමසුඛයට වඩා යම් ගුණයක් තිබේනම් කාම අග්‍ර සුඛය කියලා කියනවා.

බුදුරජාණන් වහන්සේ වදාළ මේ දෙසුමට සතුටු වුණ වේඛනස්ස, ස්වාමිනි, ආශ්චර්යක් ඉතාමත් ආශ්චර්යයි කියලා සතුට ප්‍රකාශ කළා. ඔහුගේ මේ සතුට තුළ තථාගත දහමින් ප්‍රයෝජන මෙතෙකින් නොලැබිය හැකිබව දත් තථාගතයාණෝ නැවතත් දේශනා කොට වදාරනවා.

අන්‍යාගමික දෘෂ්ඨියක් දරණ අන්‍යාගමික මත ඉවසන, අන්‍යමත රුචි කරන, අන්‍ය වැඩ පිළිවෙලක යෙදෙන, අන්‍යාගමක ආචාර්යවරයෙක් වන ඔබ කාමයන් හෝ කාමසුඛය හෝ කාමාග්‍ර සුඛය දැනගැනීම ඉතාම දුෂ්කර දෙයක්.

වේඛනස්ස යම් අර්හත් භික්ෂූන් වහන්සේලා කෙළෙස් දුරුකළාවූ භික්ෂූන් වහන්සේලා ක්ෂිණාශ්‍රව භික්ෂූන් වහන්සේලා සංයෝජන ක්ෂය කළාවූ භික්ෂූන් වහන්සේලා නම් කාමයන් හෝ කාම සුඛය හෝ කාමාග්‍ර සුඛය අවබෝධ කරගෙනයි සිටින්නේ.

මෙහෙම දේශනා කළාම පිංවතුනි, වේඛනස්ස බ්‍රාහ්මණයාට හොඳටම තරහ එනවා. බුදුන් වහන්සේ සමඟ විවාද කරනවා. "ශ්‍රමණ ගෞතමයන් තමයි නොදන්නා කෙනෙක් වෙන්නෙ කියලත් කියනවා.

භාග්‍යවතුන් වහන්සේ කරුණාවෙන් වේඛනස්ස අමතලා කියනවා. පින්වත, ඔය විධියටම ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් පූර්ව අන්තයක් අපර අන්තයත් දෙකම නොදැන ඉපදීම ක්ෂය වුණා කියනවා බඹසර වාසය සම්පූර්ණ කළා කියනවා. අමුතුවෙන් යමක් කරන්නට නැති බව කියනවා. ඔවුන්ගේ ඒ ප්‍රකාශය සිනහවට කරුණක් මයි උපදවන්නේ. ලාමක බවක් ඍණබවක් තුච්ඡබවක් මයි උපදවන්නේ.

තමා නොදන්නාකම නොදැනගත් ඒ අන්‍යාගමික ශාස්තෘවරු ඒ නොදැනීම නිසා නොදැනීමෙන්ම මිය යනවා. ඒ නිසා වේඛනස්ස කපටිකම, මායාව දුරුකරල ඍජු ගති ඇතිව, ප්‍රඥාව ඇති මානුෂීය හැඟීමෙන් මා වෙත එන්න. මම ඔබට සසුන් බඹසර දේශනා කරන්නම්. හොඳින් ශ්‍රවණය කරන්න. එම දහම පිළිපදින්න. එයින්ම ඔබට අවිද්‍යාව දුරලා. තමා විසින්ම තමාව දැකගන්න පුළුවන් වෙනවා.

වේඛනස්ස ඔබට මේ කරුණ තේරුම් ගැනීමට මම උදාහරණයක් කියන්නම්. උඩුකුරුව නිදන කුඩා බිලිඳු දරුවෙක් ඉන්නවා ඔහු බෙල්ල පස්වෙනි කොට නූලකින් බැදලයි තියෙන්නේ. මේ දරුවා වැඩිමහළු වෙනකොට අර බැමි සිදිල යනවා. එවිට මේ දරුවා දැනගන්නේ බැම්මෙන් මිදුණ කියලයි. බැඳල ඉන්නවා කියලා හෝ බැඳලා සිටිය කාලය හෝ ඔහු දන්නේ නෑ.

අන්න ඒ වගේ වේඛනස්ස කපටිකමින් මායාවෙන් තොර වෙලා යමෙක් තථාගතයන් වහන්සේ ළගට පැමිණ අනුශාසනා ලබන්නේ නම් වහ වහා සියළු සංයෝජනයෙන් මිදිය හැකිය.

තථාගතයන් වහන්සේගේ මේ දේශනාවෙන් අවබෝධය ලැබූ වේඛනස්ස සියළු මිසදිටු දෑ අතහැර සම්මා සම්බුදු පියාණන් වහන්ස, ඉතාම රමණීයයි, ඉතාම සුන්දරයි. ස්වාමීනී, මේ මොහොතේ පටන් දිවි ඇති තුරා මම තෙරුවන් සරණගිය උපාසකයෙකු වශයෙන් මාව පිළිගන්නා සේක්වායි ඉල්ලූහ. මිත්‍යා දෘෂ්ඨිය නැමැති මායාව හළ වේඛනස්ස පරිබ්‍රාජක තෙමේ තෙරුවන් සරණින් නිවීම ලදහ.

ඔබද දැන හෝ නොදැන සිදුකරන මිත්‍යා දෘෂ්ඨිය බැහැරලා සම්‍යක් දෘෂ්ඨිය ඇතිකරගෙන සැනසීම ලබත්වා.

# ලාභ උපදවන පිළිවෙත එකක්ය නිවන් ලබන පිළිවෙත අනිකක්ය....



අප බුදුරජාණන් වහන්සේ දෙව්රම් විහාරයේ වැඩවසන විට තිස්ස නම් සත්හැවිරිදි කුමාරයෙක් සැරියුත් තෙරුන් වහන්සේ වෙත පැමිණ පැවිදි විය. උන්වහන්සේ වනවාසික තිස්ස තෙරුන් නමින් ප්‍රසිද්ධ විය. මෙම හාමුදුරුවන් බලන්නට නිතර පැමිණෙන යාළු මිතුරන් නිසා උන්වහන්සේට විවේකයක් නැතිවිය. වර්තමානයේදී වුවත් මෙවැනි දේ සිදුවීම නිසා ඇතිවෙන කණගාටු දායක තත්වය ගැන සිතා බැලිය යුතුය.

මෙසේ විවේකය නැතිව වාසය කරන තිස්ස හාමුදුරුවෝ විවේක තැනක් සොයාගෙන ගොස් විදසුන් වඩා රහත්ව වනවාසී තිස්ස තෙරුන් යැයි ප්‍රසිද්ධ විය. තම මිතුරන්ගෙන් ලැබෙන ලාභ සත්කාර සියල්ල අතහැර දමා විවේක සෙනසුනක භාවනා කිරීම නිසා උසස් ආර්ය මාර්ගයට පැමිණීමට හැකිවිය. මෙයින් පෙනී යන්නේ ලාභ ලැබීම එක් පිළිවෙතකි. නිවන් පිණිස පිළිවෙත් කිරීම අනෙක් පිළිවෙතකි. වර්තමානයේ ඇතැම් අය පැවිදි බව ලබන්නේ නිවන්මඟට පත්වීම පිණිස නොවේ. ලාබ ලබමින් සතුටින් ජීවත්වීමටය. පැවිදි වීම ලාභ ලබන පිළිවෙතක් නොවන බව තේරුම් ගත යුතුය. දුකින් මිදීමට නම් ආධ්‍යාත්මික පිළිවෙත් අනුගමනය කළ යුතුය.

**කළුවච්චිමුල්ලේ ධම්මරක්ඛිත ස්ථවිර**
**ශ්‍රී සුභද්‍රාම විහාරස්ථානය**
**පුරුදුවැල්ල**
**කුඩාවැව**

## සාහිත්‍ය

# සුරස අතිරේකය







# තොටිලි වැටෙන් පනින පුතා ඒ වැටවල් බිඳිනු ඇතී

තොටිල්ලෙ ලී වැටෙන් එහා
තව වැටවල් ගොඩක් ඇතී
තොටිලි වැටෙන් පනින පුතා
ඒ වැටවල් බිඳිනු ඇතී

බුදුන් දවස මර දුවරු
ම පුතණුවන් මුණ ගැසෙතී
උන්ගේ සිව් සැට මායම්
මගේ පුතුට අරුම නැතී

බිතු සිතුවම් රූ මෙන් සිටි
මිතුරෝ හෙට සතුරු වෙතී
උන් සදනා මල පුඹු වල
මගේ පුතා බැඳෙනු නැතී



ගේය පද - මහාචාර්ය සුනිල් ආරියරත්න
තනුව හා සංගීතය - වික්ටර් රත්නායක
ගායනය - අබේවර්ධන බාලසූරිය

මවගෙ ක්ෂීරයෙන් පෝෂණය වන දරුවා ගුණෙන් ද නැණෙන් ද බලයෙන් ද වැඩෙයි. මව විසින් දරුවාට පොවන්නේ කිරි පමණක් නොවේ. නරකින් හොඳ වෙන් කර ගැනීමේ හැකියාව ද ලබා දෙන බව ජනශ්‍රැතියේ සඳහන් වේ. ඇය දරුවා නළවන්නේ තාලයට ගයන දරු නැළවිලි ගීතයකිනි. මේ නැළවිලි ගීතය තුළින් මව පියා ඇතුළු පවුලේ අය ගැනත් සමාජය ගැනත් අවබෝධයක් දරුවාගේ සියුම් මනසට ලබා දෙයි.

"ඔන්න බබෝ ඇතින්නියා
ගල් අරඹේ සිටින්නියා
ගලින් ගලට පනින්නියා
බබුට බයේ දුවන්නියා "

යනුවෙන් දරුවා වීරත්වයට නංවන්නට මව උත්සාහයක් ගනියි. ගීතයට තේමා වන්නේ ද මෙවැන්නකි.
තොටිලි වැටෙන් පනින පුතාට තමන් වටා ඉදි වන ඕනෑම වැටක් පනින්නට හැකියාව ඇතැයි පියා පවසයි. මවගේ කිරෙන් ලැබෙන ශක්තියත් පියාගේ රැකවරණය හා මග පෙන්වීම මත දරුවාට තම ජීවිතයේ හමුවන සියලුම බාධක පහසුවෙන් ජයගන්නට හැකි වනු ඇතැයි ඔහු සිතයි.

තමන්ගේ ආරක්ෂාව ආදරය යටතේ දිවි ගෙවන දරුවා යහපත් දක්ෂ දරුවකු වනු දැකීම සියලුම මාපියන්ගේ පැතුමයි. එමෙන්ම තමන්ගේ අවවාද අනුශාසනා මග පෙන්වීම් යටතේ දිවි ගෙවන දරුවා කිසිදු දිනක නොමග නොයනු ඇතැයි ද බහුතරයක් දෙමාපියෝ සිතති. එහෙත් මේ දරුවා ඉපදී ඇත්තේ සංකීර්ණ වූ විවිධ දුක් කම් කටොළු මධ්‍යයේ දිවි ගෙවන නීතියට පටහැනිව ක්‍රියා කරන මිනිසුන් බහුලව වෙසෙන සමාජයක ය. බර්ටොල් බ්‍රෙෂ්ට් මෙලෙස පවසයි.

*"දරුවකු නො ඉපදිය යුතු යුගයෙක*
*මම ඔබ බිහි කළෙමි, මක් නිසා ද*
*ඔබ පිළිසිඳ ගැනීම*
*නිර්භීත ක්‍රියාවක් හා*
*ඔබට ජීවත් වීමට සැලසීම*
*උග්‍ර සටනක් වන නිසාය.*

*යුධ හමුදාවක් පවා යුද්ධයකින්*
*පරාජය කළ හැකිය*
*එහෙත් බිළිඳුට රෙදි කඩක්*
*සොයා ගැනීම*
*යුද්ධයකින් ජය ගැන්මටත් වඩා අමාරුය.*

*ඇත්තෙන් ම පාන් සහ කිරි පවා*
*කුටිය උණුසුම් කිරීම පවා*
*මහා සටනෙකි*
*ඉතින් ඔබ මිනිසෙකු බවට පත් කිරීමට*
*මේ ජය ගැනීම් මැද මා දිවා රැය යුද්ධ කළ*
*යුතුය "*

බ්‍රෙෂ්ට් පවසන පරිදි ම තැනූ දරුවන් උස්මහත් කිරීම ද අද යුද්ධයකට වඩා අසීරු දෙයකි. දරුවකු ඉපදීමෙන් අනතුරුව ඔවුන් නූතන ව්‍යාධීන් ගෙන් ආරක්ෂා කළ යුතුය. දරුවන් අපයෝජනය කිරීමට මාන බලන අමනුෂ්‍යයන්ගෙන් දරුවන් ආරක්ෂා කළ යුතුය. වැඩිහිටි දරුවන් මත් උවදුරු වලින් ද මනස වියවුල් කරන්නන් නොමනා ප්‍රේම සම්බන්ධතා මුවාවෙන් ඔවුන් බිලි ගන්නට මානබලන්නවුන්ගෙන් දරුවා ආරක්ෂා කළ යුතුය. එපමණක් ද නොව ස්වභාවික උවදුරු වලින් ද දරුවන් බේරා ගත යුතුව ඇත. රිය අනතුරු නිසා යුද්ධය හා සමානව මිනිසුන් මියයෑම සිදු වන බැවින් උදෑසන නිවසෙන් පිටවන දරුවා යළිත් නිවසට පැමිණේදැයි අනියත බියකින් සිටින්නට දෙමාපියන්ට සිදුව තිබේ. ඇතැම් මව් පියන්ගේ අමනෝඥ ක්‍රියා හෝ විවිධ ගැටළු නිසා සිය දිවි නසා ගන්නට පෙළඹෙන දරුවෝ ද දුලභ නොවෙති.

කුස ගින්න නිවා ගැනීමට නොහැකිව හෝ පවුල් අර්බුද නිසාත් ගඟට පැන හෝ ගෙල වැලලාගෙන මිය ගිය පවුල් පිළිබඳව ද අපට අසන්නට ලැබේ. නැතිනම් පියා විසින් අපහරණයට ලක් වූ දරුවෝ පිළිබඳව ද අසන්නට ලැබේ. වැටත් නියරත් ගොයම් කා නම් අන් අය පිළිබඳ කුමක් පවසන්න ද?

තොටිල්ලේ ලී වැටෙන් එහා ඇති වැටවල ප්‍රමාණය මෙතෙකැයි අපට කිව නොහැකිය. දුෂ්කර බාධක සහිත මාර්ග විස බුමුතුරුණු ඇතිරූ මාර්ග කිසිදු තැනක දක්නට නැත. එලෙසින්ම මෙලොවට ජනිත වන දරුවා සුමගට යොමු කරන මාර්ග වලට වඩා නොමගට යොමු කරන මාර්ග බහුලව දක්නට ලැබේ.

වර්තමානයේ සෑම දිනම ප්‍රවෘත්ති තුළින් ප්‍රචාරය වන්නේ පාසල් සිසුන් ඉලක්ක කරගත් මත්ද්‍රව්‍ය වැටලීම් පිළිබඳවය. ජනමාධ්‍ය පවා ළමුන්ට විෂ එන්නත් කරන මාධ්‍ය බවට පත්ව ඇත.

ළමයින් ඉලක්ක කර ගත් කාටූන් මගින් පවා ළමුන්ට ලබා දෙන්නේ ප්‍රචණ්ඩත්වය, කලහකාරී බව, මත් ද්‍රව්‍ය භාවිතයට පෙළඹවීම් ය. ඇතැම් පරිගණක ක්‍රීඩා ළමුන් සිය දිවි නසා ගැනීම් වලට පවා යොමු කර ඇත. අන්තර් ජාලය ඔස්සේ අසැබි වෙබ් අඩවි වලට පිවිස සිය මනස විකෘති කරගන්නා දරුවෝ ද දුලභ නොවෙති.

මේ අයුරින් අතීත සමාජයට වඩා දියුණු යැයි සම්මත අද සමාජයේ ළමයින් බේරා ගත යුතු නොයෙක් උගුල් බහුලය. දෙමාපියන් අවදියෙන් නොසිටින්නේ නම් දරුවා ගේ ජීවිතය විනාශ වීම වළක්වා ගත නොහැකිව ඇත.

දරුවන් මළපුඬු වල බැඳෙනු වලක්වා ගැනීමට නම් දෙමාපියන් අවධියෙන් සිටිය යුතුය. එමෙන්ම දරුවන්ට එම උගුල් වලින් බේරීමට අවැසි දැනුවත් භාවයත්, බුද්ධිමත් භාවයත්, ප්‍රශ්න දරා ගැනීමට හැකි ප්‍රතිශක්තියත් ලබා දිය යුතුමය.

එවිට තොටිලි වැටෙන් පනින දූ පුතුන්ට නොබියව අනෙකුත් වැටවලින් ද පනින්නට හැකියාව ලැබෙනු ඇත. මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ අරුත් බර පද වැල අබේවර්ධන බාලසූරිය ගේ හඬින් ගැයෙන විට එය සියලුම රටවාසී දරුවනට ආශිර්වාදයක් සේ හැඟෙයි.

**චාමිකා ජනානි ද සිල්වා**



# බෝධින් වහන්සේ හා බැඳුනු වන්දනා ක්‍රම

"බෝධි" යන වචනය බෞද්ධ ජනතාව තුළ බුදුරජාණන් වහන්සේගේ අපරිමිත ප්‍රඥාව පිළිබඳ සංකල්පය කුලුගන්වයි. එසේම "බෝධි" යන වචනයෙන් ලෝකෝත්තර මාර්ග ඥාණය සර්‍වඥතා ඥාණය හා බෝසතුන්ට ලොව්තුරා බුදුබව ලැබීමට උපකාරීවූ ගස යන අර්ථ ගැන්වේ. බෝධි යන වචනයෙහි යථාවාදී අර්ථය නම් නිවැරදි වූද පැහැදිලි වූද, සම්පූර්ණවූද සත්‍ය අවබෝධයයි. මහාබෝධිය, ජය ශ්‍රී මහා බෝධිය, ශ්‍රී මහා බෝධිය යන නාමයන් බෝධි වෘක්ෂයට පර්යාය වශයෙන් යෙදී ඇත. මහා බෝධිය යනුවෙන් පුෂ්ප හා විපුල යන අර්ථ දෙකක් ගම්‍යමාන වන බව බෝධි වංශයෙන් පෙන්වා දෙයි. ශ්‍රී මහා බෝධිය යන්නෙන් අදහස් කෙරෙනුයේ "රශ්මියෙන් බබලන" යන්නයි. බුදු සිරුරින් මෙන්ම බෝ රුකින්ද සවනක් රැස් විහිදෙන බැවින් ඒ අරුත වඩාත් උචිත බව පෙනේ. බුදුරජාණන් වහන්සේ දස බිම්බරක් මාර සේනාව පරාජය කොට ජයග්‍රහණය ලබා ගන්නා ලද්දේ මේ බෝධි මූලයේදී බැවින් එයට "ජය ශ්‍රී මහා බෝධිය" යනුවෙන් ව්‍යවහාර කරනු ලැබේ.

අර්හත් මාර්ග ඥාණ සංඛ්‍යාත ශ්‍රාවක බෝධිය, ප්‍රත්‍යෙක සම්බෝධිය, මහා බෝධිය යන තුන් ආකාර වලට තුන්තරා බෝධිය යයි ව්‍යවහාර කරනු ලැබේ. ශාරිපුත්‍ර, මෞද්ගල්‍යාන, ආනන්ද, මහා කාශ්‍යපාදී බුද්ධ ශ්‍රාවකයන්ගේ අර්හත් මාර්ග ඥාණය ශ්‍රාවක බෝධියයි. එසේ බුදුන් වහන්සේගේ අර්හත් මාර්ගඥාණය ප්‍රතෙස්ත බෝධියයි. ලොව්තුරා බුදුවරුන්ගේ අර්හත් මාර්ග ඥාණය මහා බෝධියයි. සම්‍යක් සම්බෝධිය ලෙසද එය හැඳින්වේ. මෙයින් ලොව්තුරා බුදුවරුන්ගේ අර්හත් මාර්ග ඥාණය ඉතා ප්‍රබලය. ලොව්තුරා බුදුන් වහන්සේලාට පහළවන සියල්ල දැකීමේ සර්වඥතා ඥාණයට කෙතරම් සියුම් දෙයක් වුවද ඉතා පැහැදිලි ලෙස පෙනේ. ලොව්තුරා බුදුවරුන්ට අර්හත් මාර්ග ඥාණය සමඟම දස බල ඥාණය චතුර් වෛශාරද්‍ය ඥාණාදී සෙසු බෞද්ධ ගුණයන්ද පහළ වේ.

බෝධි වෘක්ෂ වල සර්‍වඥවරයන් වහන්සේලාට ඒ උතුම් තත්වය ලැබීමට උපකාරී වන ශක්තියක් අනුග්‍රහයක් ඇත. මහබෝසත්වරුන් බුදුවීම සඳහා බෝධි මූලයන්ට එළඹෙන්නේ ඒ නිසාවෙනි. ඒ අනුහස ඇත්තේ ශ්‍රී මහා බෝධීන් වහන්සේට පමණි. තථාගතයන් වහන්සේ බුදුවූ විගසම ඒ අසුනින් නොනැගිටී බෝධියට පිටදී සතියක්ම එතැන වැඩ සිටි සේක. එසේ තථාගතයන් වහන්සේ පරිභෝග කිරීම කියාද බෝධි වෘක්ෂය පූජනීය වස්තුවක් බවට පත්විය. ශ්‍රී මහා බෝධීන් වහන්සේට පළමු පූජාව කළේ අප තථාගතයන් වහන්සේ විසිනි. ලොව්තුරා බුද්ධත්වය ලැබූ භාග්‍යවතුන් වහන්සේ කෙළ ලක්ෂ ගණන් සමාපත්තීන්ට සමවදිමින් බෝධි මූලයේ වජ්‍රාසනයේම පළමු සතිය ගෙවා ඉන් නැගිට බෝධීන් වහන්සේට උතුරු දිසාවේ සිට සාරසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් දම් පිරූ මාගේ අදහස මේ බෝධි මූලයේදී මස්තක ප්‍රාප්ත වූයේය. එසේ කරගැනීමට උපකාරී වූ බෝධියට කළගුණ සැලකිය යුතුයි සිතා බෝධිය දෙසත් වජ්‍රාසනය දෙසත් පංච වර්ණයෙන් බබලන්නා වූ නෙත් දෙකින් ඇසිපිය නොහෙළාම සතියක් මුළුල්ලේ බලාගෙන සිටි සේක. එය නේත්‍ර පූජාවකි. එයට අනිමිස ලෝචන පූජාව යයි කියනු ලැබේ.

බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන ආකාරයට සියලුම බෝධි සත්වයන් වහන්සේලා ලොව්තුරා බුදුබව මව්කුසින් බිහිවූ දිනයේම ඉහත කී ජය භූමියෙහි ඇසටු ගසක් පැන නැගිණි. ගෞතම බුදුරජාණන් වහන්සේට එසේ බුදුවීමට සෙවණ ලබා දුන්නේ ඇසතු බෝධියයි. මේ ආකාරයට අනෙකුත් සූවිසි බුදුන් වහන්සේලාට ලොව්තුරා බුදුබව ලැබීමට උපකාරි වු බෝධීන් වහන්සේලා බොහෝ ඇත. ඒ අනුව දීපංකාර බුදුන් වහන්සේ බුදුවූයේ "පුළිල" ගසක් මුලදීය. කොණ්ඩඤ්ඤ බුදුරදුන් බුදුවූයේ "ශාල කල්‍යාණී" නම් වෘක්ෂ මුලදීය. මංගල බුදුරජාණන් වහන්සේ බුදුවූයේ නාගසක් මුලදීය. සුමන, රේවත, සෝභිත යන බුදුවරුන් බුදුවූයේ ද නා ගසක් මුලදීය. අනෝමදස්සි බුදුරදුන් බුදු වූයේ කුඹුක් ගසක් මුලය. පදුම සහ නාරද යන බුදුන් වහන්සේලා බුද්ධත්වයට පත්වූයේ "මහා සෝණ" නම් ගසක් සුලය. පදුමුත්තර බුදුරදුන් බුදුවූයේ "සල්" ගසක් මුලය. සුමේධ නම් බුදුරදුන් බුදුවූයේ බක් මී ගසක් මුලය. සුජාත බුදුරදුන් බුදුවූයේ හුණ ගසක් මුලය. පියදස්සී බුදුරදුන් බුදුවූයේ කුඹුක් ගසක් මුලය. ධම්මදස්සී බුදුරදුන් බුදුවූයේ "රත්කරව්" ගසක් මුලදීය. සිද්ධත්ථ බුදුරදුන් බුදුවුයේ "කිණිහිරි" ගසක් මුලය. තිස්ස බුදුරදුන් බුදුවූයේ "පියා" නම් ගසක් මුලය. ඵුස්ස බුදුරදුන් බුදුවූයේ නෙල්ලි ගසක් මුලදීය. විපස්සී බුදුරදුන් බුදුවූයේ "පළොල්" ගසක් මුලය. සිඛී බුදුරදුන් බුදුවූයේ "ඇටඹ" ගසක් මුලය. වෙස්සභූ බුදුරදුන් බුදුවූයේ සල් ගසක් මුලය. කකුසඳ බුදුරදුන් බුදුවූයේ "මහරි" ගසක් මුලය. කෝණාගම බුදුරදුන් බුදුවූයේ දිවුල් ගසක් මුලදීය. කස්සප බුදුරදුන් සම්බුද්ධත්වයට පත්වූයේ නුග ගසක් මූලයේදීය.

ඉපැරණි ලංකාවේද වෘක්ෂ වන්දනාව බෞද්ධයන් අතරද ප්‍රචලිතව පැවැති බවට නිදසුන් මහා වංශයේ හමුවේ. බුදු දහම ලක්දිවට හඳුන්වා දුන් නොබෝ කලකින්ම ශ්‍රී මහා බෝධි ශාඛාව ලක්දිවට වැඩම කරවීමට යුහුසුලු වීමෙන් හා බොහෝ ප්‍රදේශ වල එහි පැල රෝපණය කිරීමෙන් ජනතාව එයට දැක්වූ අනුකූලතාවය කෙතරම් ද කියා සිතිය හැක. ඒ ආකාරයට දඹකොළ පටුනේ සිට අනුරාධපුරය දක්වාද රට ඇතුලේ නොයෙක් ප්‍රදේශවල මේ බෝධි වන්දනාව ඉතාම සීඝ්‍රයෙන් ජයප්‍රිය වූ සැටි අෂ්ටඵලරුහ හා දෙතිස් ඵල රුහ බෝධි පිහිටුවීම පිළිබඳ පුවත්වලින් අනාවරණය වේ.

මේ ආකාරයට බෝධීන් වහන්සේලා මූලික කරගෙන ආරම්භ කරන ලද බෝධි පූජා පුරාණ රාජ්‍ය සමයේ සිට රජදරුවන්ගේ හා ප්‍රභූන්ගේ අනුග්‍රහය යටතේ පැවැත්වූ බව බෞද්ධ ඉතිහාසයේ සඳහන් වේ. විශේෂයෙන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ නැවීම සඳහා අනුරාධපුර තිසා වැවේ සිට මුරා යුධ සේසත් කොඩි, උඩුවියන් සහිතව පෙරහැරකින් ජලය රැගෙන විත් නැවීම සිදුකොට වර්ෂාව නැති නියඟය පවතින කාල වකවානුවලදී වර්ෂාව ලබාගැනීමට ප්‍රාර්ථනා කළ බව සඳහන් වේ. (People of Anuradhapura and the surrounding districts believe that the sacred - Bodi -tree can bring down rain and when the dry season is prolonged and rains are delayed, water is taken from the Tisa wava in procession and poured at the roots of the Bodhi and sprinkled at it and by this they expect the rains to come down)

මීට අමතරව යම් යම් ආකාරයේ ප්‍රාර්ථනාවන් ද කළ බවත් ඒවා බොහෝ දුරට ඉටුවූ බවත් වංශ කතාවල සඳහන් වේ.

ඩී. එම්. එච්. කරුණාරත්න



# සංසාර ගමන

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන විට ශාස්වත දෘෂ්ඨීය හා උච්ඡේදවාදය ඇසුරු කොට ගෙන පැවති දෙසැටක් වූ මිත්‍යා දෘෂ්ඨී ප්‍රතික්ෂේප කොට සත්වයා භවයෙන් භවයට ආත්මයෙන් ආත්මයට රැගෙන යන්නේ මැවුම්කාර දෙවියෙකුගේ හෝ මහා බ්‍රහ්මයාණ කැමැත්තට අනුව නොව ඒ පුද්ගලයා විසින් ගොඩනගා ගන්නා ලද කර්ම ශක්තියට අනුවය. මේ ආකාරයට නැවත නැවත ඉපදීමට බලපාන ප්‍රධාන හේතු සාධක නම් තෘෂ්ණාව ප්‍රධානව ඇති කරගන්නා ලද ක්ලේෂයන් නිසා බව බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවල දේශනා කළ සේක. මෙලොව පවතින යථාර්ථය හෙවත් කිසිවෙකුට මෙය සත්‍යය නොවේය යනුවෙන් ප්‍රකාශ කළ නොහැකි සත්‍යය සතරාකාරය. එය චතුරාර්ය සත්‍යය ලෙස හඳුන්වයි. ලෝකයේ පවතින සදාතනික උතුම් සත්‍යය යන අර්ථයෙන් මෙය චතුරාර්ය සත්‍යය ලෙසසලකයි. බුද්ධත්වයට පත්ව පළමු ධර්ම දේශනාවේදීම ලෝකයේ පවතින සත්‍යය මනාව විග්‍රහ කොට පැහැදිලි කොට ඇති බව ධම්ම චක්ක පවත්තන සූත්‍රය පිළිබඳ විමසා බැලීමේදී පැහැදිලි වේ. එම සත්‍යය සතර මෙසේය.

දුක්ඛ සත්‍යය
දුක්ඛ සමුදය සත්‍යය
දුක්ඛ නිරෝධ සත්‍යය
දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා සත්‍යය

ඉහත දැක්වූ චතුරාර්ය සත්‍ය පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ සත්වයා තුළ සන්තානගතව පවතින දුකට ප්‍රධාන හේතු සාධකයක් ලෙස තෘෂ්ණාව පැහැදිලි කරයි. මහණෙනි, මෙම චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ නොකර ගැනීම නිසා මටත් ඔබටත් බොහෝ කාලයක් මේ සසර තුළ සැරි සරන්නට සිදුවූ බව සංයුක්ත නිකායේ කෝටිගාම වග්ගයේ දේශනා කොට ඇත. ඉපදීමට හේතු සාධක වන කෙළෙස් ධර්මයන් සම්පූර්ණයෙන්ම නැති කිරීම තුළින් දුකින් එතෙර විය හැකිය. මෙම කෙළෙස් ධර්මයන් අතර තණ්හාව මූලික වන්නේ අල්ලා ගැනීම හේතුකොට ගෙන පුනර්භවය ඇතිවන බවයි. එම නිසා තව තවත් දුකට පත්වන බවයි. සත්වයා දුකට පත් කරවමින් භවයෙන් භවයට ගමන් කරවන තෘෂ්ණාව පිළිබඳ විමසා බැලීම වැදගත් වේ.

න නහාපණ වස්සෙන තිත්ති
කාමෙසු විජ්ජති
අපපස්සදා දුඛා කාමා ඉති
විඤ්ඤාය පණ්ඩිතො

ධම්මපදයේ බුද්ධ වග්ගයේ සඳහන් ඉහත ගාථාව තෘෂ්ණාව නිසා දුකට පත්වන බව පෙන්වා දෙයි. මිනිසාට කහවණු වැස්සකිනුත් කාමයන්හි තෘප්තියක් ඇති නොවේ. මේ නිසා කාමයො සිහිනයෙන් පානය කළ පැන් මෙන් මඳ ආස්වාස ඇත්තාහ. බොහෝ දුක් ඇති බව පණ්ඩිතයෝ නුවණින් දනගත යුතුය යනු එහි අදහසයි.

මේ ආකාරයට බලනවිට විෂම වූ කෙලෙස් ධර්මයන්ගෙන් පිරුණු පුහුදුන් සත්වයා තෘෂ්ණාව හේතුකොට ගෙන දුක්ඛිත ස්වභාවයට පත්වෙයි. තමන්ගේ සසර ගමන දික්කර ගනියි. තණ්හාව දුකෙහි උපත බවත් දුක උපදවන දෙය බවත් තණ්හාව දෙවැනි කොටගත් පුද්ගලයා සසරින් එතෙර විය නොහැකි බවත් අංගුත්තර නිකායේ තණ්හා සූත්‍රයේදි මෙන්ම ඉතිවුත්තක පාලයේ එන තණ්හුප්පාද සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. සත්වයා කවරෙකු විසින් උපදවන්නේදැයි දෙවියෙකු විසින් අසන ලද ප්‍රශ්නයකට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ පිළිතුර වූයේ සත්‍වයා විසින් උපදවන බවයි. ඒබව ජානෙති සූත්‍රයේ මැනවින් විස්තර වේ.

තෘෂ්ණාව හෙවත් තණ්හාව ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදෙයි. එයින් පළමුවැන්න කාම තණ්හාවයි. එනම් ඇස, කන, නාසය, දිව, ශරීරය යන පංචකාම ඉන්ද්‍රියන් තුළින් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු පිනවීමට දක්වන කැමැත්තයි. යමෙක් තම ඇසට පෙනෙන ලස්සන රුවක් කෙරෙහි ඇල්මක් ඇති කරගනියි. ඉන්පසු එය තමා සන්තක කරගන්නට නොයෙක් දුක් කම්කටොලු විදියි. තමා කැමති දේ ලබාගත්තද එය රැකගැනීමට තව තවත් දුක් විදියි. එය නොලැබුණහොත් නොලැබීම හේතුකොටගෙන දුකට පත්වෙයි. මෙය පහසුවෙන් තේරුම් ගැනිමට උදාහරණයක් ලෙෂ පුද්ගලයෙක් ලස්සන නිවසක් සෑදීමට ආශා කරයි. ඔහු ඒ වෙනුවෙන් බොහො සේ වෙහෙසෙයි. විවිධ දුක් ගැහැට ඒ වෙනුවෙන් විදියි. එම නිවසත් සාදා අවසන් වුවත් ඊටපසු එය රැකගැනීමට ජීවිතය කැප කරයි. දුකට පත්වෙයි. එම නිවස නිමකර ගැනීමට නොහැකි වුවහොත් ඒ පිළිබඳව සිතමින් දුක විදියි. ඇස මෙන්ම කන, නාසය, දිව, ශරීරය යන අනෙක් ඉන්ද්‍රියන් පිනවීමට ගන්නා උත්සාහය අවසානයේ දුකක් බවට පත්වෙයි. මෙය කාම තණ්හා යනුවෙන් හඳුන්වයි.

තණ්හාවේ දෙවැන්න භව තණ්හාවයි. ශාස්වත දෘෂ්ඨිය හේතුකොටගෙන රූප ලෝකවල හා අරූපී ලෝකවල ඉපදීම පිළිබඳව ඇති කැමැත්ත හා ධ්‍යාන සුවය පිළිබඳව ඇති සියුම් ආශාව ද භව තණ්හාව ලෙස හඳුන්වයි. ලෝභය හා ජීවිතය පිළිබඳ තදින් අල්ලා ගැනීම පිණිස හේතුවන ආශාව හෙවත් කැමැත්ත ද භව තණ්හාව ලෙස දැක්විය හැකිය.
ආත්මය හා සත්වයා සදාකාලිකය වෙනස් නොවේය යනුවෙන් ඇතිකරගන්නා වැරදි විස්වාමය ශාස්වත දෘෂ්ඨිය ලෙස හඳුන්වයි. ඉහත දැක්වූ රූපි භව නම් රූපී බ්‍රහ්මලෝක දාසයයි. අරූපී භව යනුවෙන් දැක්වූයේ අරූපී බ්‍රහ්මලෝක සතරයි. මෙම විසිවැදෑරුම් වූ භවයන් පිළිබඳව ඇති කැමැත්ත හෙවත් ආශාව භව තණ්හාවයි.

තණ්හාවේ තෙවැන්න විභව තණ්හාවයි. මරණින් මත්තෙහි සත්වයාගේ යළි ඉපදීමක් නොවන බපවත් මේ ජීවිතයෙන්ම අවසන් වන බව කියවෙන උච්ජේද දෘෂ්ටිය සමඟ ඇති කරගන්නා කැමැත්ත හෙවත් ආශාව විභව තණ්හා යනුවෙන් හඳුන්වයි. මේ ආකාරයට කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යනුවෙන් තෙවැදෑරුම් වූ තෘෂ්ණාව තවදුරටත් කොටස් වලට බෙදී එකසිට අටවැදෑරුම් බව වන අටුවා ග්‍රන්ථවල සඳහන් වේ.


තෘෂ්ණාව හේතුකොටගෙන භවයෙන් භවයට ආත්මයෙන් ආත්මය ගමන් කරන සත්වයාගේ ඉපදීම හෙවත් පුනර්භවය නැති කිරීමට නම් තෘෂ්ණාව හෙවත් තණ්හාව ආශාව සම්පූර්ණයෙන් නැතිකළ යුතු බව නොයෙක් දේශනා තුළ සංක්ෂිප්තව දක්වා තිබේ.

මේ අයුරින් තෘෂ්ණාව ප්‍රහීන කිරීම හේතුකොට ගෙන සදාතනික සුවය හෙවත් නිර්වාණය පසක් කර ගැනීමට හැකිය. ලෝකය පිළිබඳව සත්වයා පිළිබඳව නිවැරදි අවබෝධ කොටගෙන තෘෂ්ණාව ප්‍රධාන සියලු කෙලෙස් ප්‍රහීන කරමින් දානාදී පුණ්‍ය කටයුතුවල නියැලිය යුතුය. තෘෂ්ණාව නැතිකිරීමට නම් අනිවාර්යෙන් දාන පාරමිතාව පූරණය කළ යුතුය. දානය තුළින් ලෝභය ක්‍රමයෙන් අඩුවෙයි. අත්හැරීම ප්‍රගුණ කිරීම දානය තුළින් සිදුකිරීම නිසා සියලු දේ පිළිබඳව ඇති තණ්හාව ප්‍රධාන කෙලෙස් ධර්මයෝ නසා පාරමී ධර්මයන් සම්පූර්ණ කොට ධර්මානුකූලව ජීවත්ව පඤ්ඤාවෙන් යුක්තව කටයුතු කොට උතුම් නිර්වාණය පසක් කරගැනීමට පිණැති නුවණැති සත්වයෝ අප්‍රමාදීව කටයුතු කෙරෙත්වා...

පූජ්‍ය ගල්නෑවේ
පඤ්ඤාරාම හිමි

බහුං වේ සරණං යන්ති
පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛ චෙත්‍යානි
මනුස්සා භය තජ්ජිතා

බෞද්ධයාගේ අත්පොත වන උතුම් ධම්මපදයේ බුද්ධ වග්ගයේ සඳහන් වන ඉහත ගාථාව මගින් පැහැදිලි වනුයේ බියෙන් තැතිගත් මිනිස්සු පර්වත, කැලෑ, ආරාම, ගස්, චෛත්‍ය යන මේ දේ බොහෝ සෙයින් සරණ යති යන්නයි.



# ආගමික පුදපූජා විධි හා බෞද්ධ ප්‍රතිපදාව

මේ අයුරින් බලන කළ සමස්ථ ජීවී සමාජයේ පොදු අවශ්‍යතාවය මත එදා සිට මේ දක්වා විවිධ පුද පූජා ආගමික විශ්වාස ඇදහිලි ජනතාවට සමීප වී ඇත. එය මුළු මහත් විශ්වයටම සාධාරණ වූ කාරණයකි. එනම් මිනිසාගේ සැක බිය දුරු කිරීම සඳහා ලොව පහළ වී තිබුණු විවිධ ස්වාභාවික වස්තූන් දේවත්වයෙන් සළකා පුද පූජා පැවැත්වූ බවයි. එමගින් විවිධ ආගමික විශ්වාස ඇදහිලි සමාජයට සම්ප්‍රාප්ත වී ඇත.

මෙහිදි ආගමික පුද පූජා අනු මාතෘකා දෙකක් ඔස්සේ තොරතුරු අනාවරණය කරයි.

1. සමකාලීන ආගමික පුදපූජා
2. නූතන ආගමික පුදපූජා

භාරතීය සමාජයේ බුදුරදුන් පහළ වීම දක්වා කාලය යුග තුනකි. එනම්,

1. බහුදේව වාදය
2. ඒක දේව වාදය
3. අදේව වාදය

බහුදේව වාදී යුගයේදී මූලිකව ත්‍රි මූර්තිය පිළිගනු ලැබීය. බ්‍රහ්ම, විෂ්ණු, ශිව යනු එම ත්‍රිමූර්තියයි. මෙකල බොහෝ දෙවිවරු විශ්වාස කළ යුගයකි. ආකාශස්ථ, භූම්‍යස්, යනුවෙන් එය දෙයාකාරය.

චන්ද්‍ර, සූර්ය, වායු, මේඝ, මරුත්, පර්ජන්‍ය, රුද්‍රා විෂ්ණු ආදී දෙවිවරු ආකාශස්ථ වශයෙන්ද, අග්නි, සෝම, සරස්වති, පෘථිවි භූම්‍යස්ථ දෙවිවරු හැටියට ද සළකා ඇත.

අනතුරුව කාලයාගේ ඇවෑමෙන් ඇති වූ ඥාන පරිපාකයන් සමඟ විශ්වයත් සත්වයාත් පිළිබඳ සංකල්පය දියුණු විය. ඒ අනුව සර්ව බලධාරි දෙවියන් පිළිබඳ හැඟීමක් පහළ විය. තවද ස්වාභාවික වස්තූන් වලට ද නායකයෙකු ඇතැයි ඔවුහු විශ්වාස කළහ.

සියලු ස්වාභාවික වස්තූන් අවස්ථාවෝචිතව විටින් විට මිනිසාට යහපත මෙන්ම අයහපත ද උදා කරමින් ක්‍රියාත්මක වන්නේ යම්කිසි නායකයෙකුගේ කැමැත්ත පරිදි බව එකළ ජනතාව විශ්වාස කරන්නට වූහ. ඒ අනුව ලොව සියල්ල එකම දෙවියා වන මහා බ්‍රහ්මයා විසින් මවා ඇති බව වැඩි දුරටත් පිළිගන්නට වූහ.

මේ අනුව මහා බ්‍රහ්මයාගේ කැමැත්ත අනුව බ්‍රහ්මණ ධර්මය එකළ සමාජයට දායාද විය. එහි ඉගැන්වෙන,

- උපනයන චාරිත්‍රය (ද්විජ)
- ආශ්‍රව ධර්මය

ආගමික පූජා විධි දෙකකි. ''පූනනූල'' ගෙල පළඳමින් බ්‍රාහ්මණ දරුවා ළමා වයසේදීම බමුණු සමාජයට සම්බන්ධ කරගනී.

ජීවිතයේ අවස්ථා 4ක් අනිවාර්ය කටයුතු සඳහා යොමු කරවමින් ආශ්‍රව ධර්ම හඳුන්වා දී ඇත.

**බ්‍රහ්මචාරි - කුමාර අවධිය**
**ගෘහස්ථ - තරුණ අවධිය**
**වානප්‍රස්ථ - තලතුනා අවධිය**
**සන්‍යාසි - මහලු අවධිය**

තෙවනුව අදේව යුගය පහළ වේ. එනම් බෞද්ධ යුගයයි. මෙකළ ලොව මැවූ දෙවියෙක් පිළිබඳ විශ්වාස නොකරයි. කිසිවක් කිසිවෙකුගේ කැමැත්ත මත සිදු නොවේ. හේතුඵල දහම අනුව සියල්ල සිදුවේ.

යෙ බ්‍රාහ්මණා බාහිත පාප ධම්මා පව් බැහැර කළ හෙයින් බ්‍රාහ්මණ නම් වේ.

''ඛෙත්තානං අධිපතිති ඛත්තියො'' - කෙත්වතු වලට අධිපති වූ හෙයින් ක්ෂත්‍රිය නම්වේ.

**''අත්තාහි අත්තනො නාතො කොහිනාතො පරොසියා''**

තමාට තමා හැර වෙන පිහිටක් සරණක් නැත. යනුවෙන් බුදුරජාණන් වහන්සේ ලොවට සත්‍ය දේශනා කරන්නට වූහ.

ඒකදේව වාදි යුගයේ සිට පැවත එන බ්‍රාහ්මණ චින්තන හා ශ්‍රමණ චින්තනය තුළ භාරතීය සමාජයේ විවිධ පුදපූජා රාශියක් පහළ වන්නට වය. ඒවා පොදුවේ යාගහෝම (යාඥා) නමින් හඳුන්වයි. එය ප්‍රධාන කොටස් දෙකකි.

1. හිංසක යාඥා
2. අහිංසක යාඥා

බමුණු හා ශ්‍රමණ සංස්කෘතිය තුළ හිංසක යාඥා ප්‍රධාන වශයෙන් පැවති අතර අහිංසක යාඥා බුදුදහමේ පදනම් කරගෙන ක්‍රියාත්මක විය.

ඒ අතර බමුණු දහමට අනුව,

- පීතෘ යාගය
- පුංසවන යාගය

ජනප්‍රිය පුදපූජා ක්‍රම 2කි. පියා මිය ගියාට පසු පිරමි දරුවෙකු විසින් කළ යුතු පුද පූජා යාගහෝම පිතෘ යාගය හෙවත් පිතෘ දානයයි. එය කළ හැක්කේ පිරිමි දරුවෙකුට පමණක්ම යැයි ඉගැන්වූහ.

එනිසාම එකළ සමාජය පිරිමි දරුවෝම පැතූහ. දරු කළලයක් මව් කුසට පැමිණි පසු මාස තුනක් ගත වන විට පිරිමි දරුවෙකුම පතා දෙවියන්ට යාගහෝම කිරීම පුංසවන යාගය වශයෙන් හඳුන්වා ඇත.මීට අමතරව එකළ පැවති පංච විධ යාගයන් පිළිබඳ බුදුරදුන් සංයුක්ත නිකායේදී දක්වා තිබේ.

**''අස්සමේධං පුරිසමේධං සමමාපායං වාජපෙය්‍යං නිරග්ගලං**
**මහායඥා මහාමේඝා නතේ හොන්ති මහප්ඵලා''**

1. අශ්වමේධ
2. පුරුෂමේධ
3. සම්මාපාය
4. වාජපෙය්‍ය
5. නිරග්ගල

යන මේ යාගයන් කිසිඳු මහත්ඵලයක් නොවන බැව් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.

අශ්වයින් සිය ගණන් රැස්කොට ඔවුන් මරා එම ලේ ගින්නට වත්කොට රටට සමෘද්ධිය පැතිම අශ්වමේධ යාගයෙන් සිදු කෙරේ. බුදදහම මේ වෙනුවට සස්මේධ උගන්වයි.

එනම් ධාන්‍ය වගාවයි. පුරුෂමේධ යනු විවිධ තරාතිරමේ පුරුෂයන් මරා එම ලෙයින් කරන යාගයකි. බුදදහම ඒ සඳහා පුරුෂ බලය යොදා රට සමෘද්ධිමත් කිරීම හඳුන්වා දී ඇත. සවිබලැති පුරුෂයකු විසින් විදින ලද හීය වැටුණු තැන් කළ යාගය සම්මාපාය නම් වේ. දිළිදු මිනිසුන්ට කිසිදු ලියවිල්ලක් හෝ පොළියක් නොමැතිව දහස් ගණන් මුදල් දී ඔවුන් රටේ සමෘද්ධියේ කොටස් කරුවන් කර ගැනීම ඊට ප්‍රතිවිරුද්ධ ක්‍රියාදාමයයි.

ශාස්ත්‍රපති
බුදුගල සෝමරතන හිමි
බුදුගල රජමහ විහාරය
බලංගොඩ

යමෙක් කයින් හෝ වචනයෙන් කුඩා හෝ පාපකර්මයක් සිදුකෙලේ නම් නුවණැත්තන්ගේ නින්දාවට පාත්‍රවේ.

- කරණීය මෙත්ත සූත්‍රය -





# රට, දැය, සමය රැකගත්

# අනගාරික ධර්මපාලතුමා

1864 සැප්තැම්බර් මස 17 දින කොළඹදී උපත ලද ධර්මපාල තුමාගේ නිජ බිම දකුණු පළාතේ හිත්තැටිය ග්‍රාමයයි. දොන් කරෝලිස් හේවාවිතාරණ මහතා පියාණන් වූ අතර මල්ලිකා හේවාවිතාරණ මහත්මිය මෑණියන් බවට පත් වූවාය. පවුලේ ප්‍රථම දරුවා ලෙස උපත ලද ධර්මපාල තුමාට උපතේදී තැබූ නම වූයේ දොන් ඩේවිඩ් හේවාවිතාරණයි. දෙමටගොඩ බැප්ටිස්, කොළඹ ශාන්ත බෙනඩික්, කෝට්ටේ ක්‍රිස්තියානි විද්‍යාලය හා මෝදර තෝමස් යන විද්‍යාලයෙන් ද අධ්‍යාපනය ලැබූ එතුමාගේ අවසන් පාසල වූයේ කොළඹ රාජකීය විද්‍යාලයයි. මේ පාසල ක්‍රිස්තියානි පසුබිමක තිබූ නිසා විද්‍යෝදය පිරිවෙනේ වැඩ විසූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගෙන් හා හෙයියන්තුඩුවේ දේවමිත්ත නාහිමියන්ගෙන් බුදු දහම හා පාලි භාෂාව ඉගෙන ගැනීමට ඩේවිඩ් තරුණයාට අවස්ථාව ලැබුණි.

මේ අතර පානදුරාවාදය පොත කියවූ ඇමරිකානු ජාතික ඕල්කට්තුමා සහ රුසියානු ජාතික බැලස්කි මැතිණිය ලංකාවට පැමිණ වැලිවත්තේ විහාරස්ථානයේ දී තිසරණ සහිත පංච ශිලයේ පිහිටා ප්‍රසිද්ධියේම බුදු දහම වැළඳගනු ලැබූහ. මේ සමයේදී ශ්‍රී ලංකාව ඉංග්‍රීසීන්ට යටත්ව තිබූ නිසා සිංහල බෞද්ධයා දැඩි පීඩාවට පත්ව සිටි අතර ඕල්කට්තුමාගේ මෙම ක්‍රියාව මහත් අස්වැසිල්ලක් විය. සිංහල බෞද්ධයින් නගා සිටුවීමට කොළඹ ආනන්ද, මහනුවර ධර්මරාජ, ගාල්ලේ මහින්ද වැනි බෞද්ධ පාසල් ආරම්භ කළ ඕල්කට්තුමා ගමින් ගමට ගොස් බෞද්ධයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ දේශනා පැවැත්විය. ජාතික ආගමික හැඟීම් පුබුදුවාලන එම දේශනාවන් ශ්‍රවණය කළ ඩේවිඩ් තරුණයා ඕල්කට්තුමා සමඟ එක් වී තම ඩේවිඩ් යන කිතුණු නාමය අතහැර ධර්මපාල හේවාවිතාරණ ලෙස තම නාමය වෙනස් කරගත්තේය. තම දේශනා නිර්භීතව අවංක චේතනාවෙන් කළ නිසා ධර්මපාල තුමා එකල ලංකාවේ විසූ දක්ෂතම කථිකයා බවට පත්විය.

1893 සැප්තැම්බර් මස 11 වන දින සිට 27වන දින දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ චිකාගෝ නුවර පැවති ලෝක ආගම් පිළිබඳ සම්මන්ත්‍රණයට ආරාධනාවක් මත ධර්මපාලතුමා සහභාගි විය. එහිදී සම්බුද්ධ චරිතය චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ඨාංගික මාර්ගය විස්තර කරමින් පවත්වන්නාවූ දේශනාවන් හේතුවෙන් ශ්‍රාවක පිරිස් වශී වී ගියේය. එම අවස්ථාවේදීම ස්ටුවට් නම් ඉංග්‍රීසි ජාතිකයා බුදු දහම වැළඳ ගත් අතර බෞද්ධ දේශනා සඳහා දිගින් දිගටම ධර්මපාල තුමාට ඇරයුම් ලැබිණි. මෙම සිදුවීම ඇමරිකාවේ බොහෝ පුවත්පත්වල පලවිය.

එම සමුළුවට සහභාගී වී මෙරටට නැවත පැමිණෙන අතර මගදී ඔනනොළුව වරායට පැමිණි ධර්මපාල තුමාව දැක ගැනීමට බොහෝ පිරිසක් රැස් වී සිටි අතර එම දිවයිනේ කෝටිපතිනියක වූ මේරි කෝස්ටර් මැතිනිය ද මේ අතර වූවාය පසුව ධර්මපාලතුමාගේ ධර්මදූත සේවයට එතුමිය ලක්ෂ ගණනින් මුදල් ආධාර කළාය. මේ කාලය වන විට බුදුදහම ඉන්දියාවෙන්  අතුරුදහන් වී බෞද්ධ සිද්ධස්ථාන වල් වැදී තිබුණි. ධර්මපාලතුමා ඉන්දියාවට යන විට ඉසිපතන මිගදාය භූමිය වනයෙන් වැසී ගොස් තිබූ අතර වෙහෙර විහාර දාගැබ් විනාශ කොට ජනතාවගේ ප්‍රයෝජනය පිණිස ගල් කණු කරත්තවල පටවාගෙන යනු දුටු එතුමාගේ සිත බලවත් ලෙස කම්පාවට පත් වූ බව කියැවේ.

1902 ජනවාරි මස බරණැස ඉසිපතන මිගදායේ ඉඩම් කොටස් එතුමා මිළදී ගන්නා ලදී. බමුණන්ගේ බොහෝ විරෝධතා කුමන්ත්‍රණ මධ්‍යයේ මූලගන්ධ කුටි විහාරය සෑදීම ආරම්භ කොට 1930 දී පමණ සම්පූර්ණයෙන්ම එහි වැඩ කටයුතු නිම කෙරිණි. 1881 ජනවාරි 22 දින ප්‍රථම වතාවට බුද්ධගයා භූමියට ගිය ධර්මපාලතුමාට දකින්නට වූයේ මහන්තා නම් හින්දු පූජක යටතේ ශ්‍රී මහා බෝධීන් වහන්සේත් බුද්ධගයා මහා විහාරයත් පවතින ආකාරයයි. මෙතැන් සිට බුද්ධගයාව බේරා ගැනීම සඳහා තම උපරිම වීරිය යෙදූ ධර්මපාලතුමා ඒ සඳහා 1881 මැයි මස 31 වන දින හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ සභාපතිත්වයෙන් මහා බෝධි නමින් සමාගමක් පිහිටුවා ගන්නා ලදී. ''සිංහලයිනි නැගිටිව්. බුද්ධගයාව බේරා ගනිව්.'' යන අභීත හඬ ලංකාව පුරා පතුරුවා ලෝකයේ අනෙකුත් බෞද්ධ රටවල් හා එක්ව කටයුතු කළේය. බුද්ධගයා භූමියෙන් ඉඩමක් මිළට ගෙන ආවාසයක් කරවා එහි භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කරන්නට ද සැළැස්වූහ. මේ අතර මහන්තාගෙන් පැමිණුන දැඩි බලපෑම්වලට ද මුහුණ දෙමින් ලෝක බෞද්ධයින් සමඟ බුද්ධගයාව බේරා ගැනීමට නොබියව ක්‍රියා කළේය. කල්කටාවේදී මහා බෝධි සමාගමක් පිහිටුවා එහි ධර්මරාජික විහාරය නමින් බෞද්ධ මධ්‍යස්ථානයක් ද පිහිටවනු ලැබීය. ඒ වන විට මෙම ප්‍රදේශයේ හින්දු භක්තිකයන් ප්‍රබලව සිටි නිසා ඉන්දීය රජය ද මෙම ගැටළුවට අවධානය යොමු කළේ නැත. නමුත් ලෝක බෞද්ධ ජනතාවගේ උද්ඝෝෂණ නිසා බුද්ධගයා නඩුව ක්‍රියාත්මක විය. අවසානයේ දී කල්කටා ශ්‍රේෂ්ඨාධිකරණයේදී බුද්ධගයා විහාරයේ අයිතිය බෞද්ධයින්ට ලැබිය යුතුයැයි තීරණය කළ අතර මෙම නඩුව බෞද්ධ ඉතිහාසයේ සුප්‍රසිද්ධ නඩු තීන්දුවක් බවට පත් විය. එනම් ලේ බිඳුවක්වත් නොසොලවා නැතිව බුද්ධගයාව මෙසේ බේරාගත් නිසා, මේ වන විට නේපාලය, බුරුමය, තායිලන්තය, ජපානය, ටිබෙටය, චීනය, කොරියාව, කාම්බෝජය, ශ්‍රී ලංකාව වැනි රටවල බෞද්ධ ජනතාව කිසිදු අපහසුතාවයකින් තොරව බුද්ධගයා භූමිය වැඳ පුදා ගනිති.

1912 දී මෙතුමා සිංහල බෞද්ධයින් තුළ ජාතික ආගමික හැඟීම් ගොඩනැංවීමට ගමින් ගමට ගොස් දේශනා පැවැත්වූහ. තම ධනය පවා වියදම් කරමින් බුදු දහමත් සිංහල ජාතියත් ගොඩ නැංවීමට කටයුතු කළ එතුමා 1931 වසරේ විද්‍යෝදය පිරිවෙනේදී ලංකාව තුළ තම අවසන් දේශනය පවත්වා දඹදිව බලා නික්ම යන ලදී. මේ වනවිට 57 වන වියේ පසු වූ ධර්මපාලතුමා 1931 ජූලි මස 31 වන දින පූජනීය බෝරුක්ගමුවේ ශ්‍රී රේවත ස්වාමීන් වහන්සේ යටතේ සිරි දේවමිත්ත ධර්මපාල යන නමින් උතුම් පැවිදි ජීවිතයකට ඇතුළු වූහ. 1933 ජනවාරි 17 වන දින අධිශීල උපසම්පදාවට පත් වූ අතර 1933 අප්‍රේල් මස 29 වන දින උන්වහන්සේ බරණැස් නුවර දී අපවත් විය.

එච්.එම්.පී.කේ. සේනාධීර